

ධීර
තීක්ෂණා දින්ලිනී
වෙලේගෙදර

# ඕර්

කතෘ:- තීක්ෂණා දින්ලිනී වෙලේගෙදර

කතෘගේ වෙනත් කෘති

¥ නොනිවුණු ගිනිදැල්

¥ (අ)ප්‍රකාශිත

¥ හදවතක රිද්මය

මහ/මහමායා බාලිකා විද්‍යාලය

මහනුවර

9C

2026/05/10

9786242089577

*පිදුම*

*ලේ කිරි කර පොවා මාව මෙලොවට බිහි කර,ජීවිතේ තබන සෑම අඩියක් පාසාම මා අසලින්ම රැදී සිටින අම්මාට සහ සෑම මොහොතකම මා පසුපස සෙවනැල්ල මෙන් සිටිමින්,වැටෙන අවසස්ථාවලදී නැගිටින්න අත දුන් සෙනෙහෙබර අප්පච්චීට ආදරයෙන්.......*

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපානයෙ හැරවුම් ලක්ෂයක් ලෙස මහමායා බාලිකා විද්‍යාලයෙ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව ව්‍යාපෘතිය නම් කල හැක. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත් කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවර වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්ණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවි ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරට අංගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩම කර වූ හේමමාලා කුමරියට උපහාරයක් වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුබවතුන් ඇතුළු සැමට ස්තුතිය පුද කරමි.

ශෂිකලා සේනාධිර

විදුහල්පතිතුමිය

මහමායාබාලිකා විද්‍යාලය

මහනුවර

සුභාශිංසන පණිවුඩය

මහනුවර මහමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ආණ්ඩුකාර වර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර,එය පොත් පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ.සිසු දරුවන්ගේ දක්ෂතා,නිර්මාණශීලිත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව,සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබා දෙනු ඇති බව විශ්වාස කරමි.එමෙන්ම මෙවැනි උත්සහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සදහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරුමංණ්ඩලය, සිසුදරුවන් සහ සම්බන්ද වූ සියලු දෙනාට මාගේ හර්ද්‍යාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමෙ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අඹිහයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත,

සම්මානනීය මහාචාර්ය,පේරාදෙනිය විශ්වවිද්‍යාලය,

2026.05.10

සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල් වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මංඩලය,ශිෂ්‍යා දියණිවරුන්ට,සෙසු පාසල් වල දූ පුතුන්ට සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයන්තය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්,අනිවාර්ය,ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතේදී බුද්ධිමත් කුසලතා පූර්ණ සුරපාපි පරපුරක් බිහිකිරීමටත් කැපවී සිටී.එවන් පසුබිමක සුසමාහිතවූ සමබර ඒරුෂයක් සඳහා නිර්මාණ හැකියාව,විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථ කරණ වැඩසටහන හේතුපාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේම මාලා උපහාර ග්‍රන්ථ කරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාළිගාව,

2026.05.10.

*පූර්විකාව*

*වෘත්තීය ජීවිතයේ මෙන්ම පෞද්ගලික ජීවිතයේදී ඇයට මුහුණදීමට සිදුවූ අභියෝග මෙන්ම ඇයට විසඳීමට බාරවුණු පරීක්ෂණ කිහිපයක එකතුවකි.*

*නවීනා ඒකනායක ඝාතන නඩුව*

*බැංකු මංකොල්ලය*

*මහසෝන් අවතාරය*

*අගමැති ඝාතනයට තැත් කිරීම*

*කතාව සමගින් එක්වන්න.*

<u>ඒකනායක ඝාතන නඩුව</u>

**අන්සතු ඔබ වෙත මගෙ හිත බැඳිලා**

**ඔබ ගැන සෙනෙහස හිත තුල පිරිලා**

**සම්මතයෙන් පිට ප්‍රේමෙක වෙලිලා**

**මග හැර යන්නට බැරිලෙස බැඳිලා**

**සෙනෙහස උතුරන වදනට සිත් වී**

**ඔය නෙතු අද්දර නවතිනු රිසිවී**

**දැන දැන හිමි නොවනා-**

"උඹ සින්දු කිය කිය හිටපන් ධීර්...."

"අයියෝ...සර් කැවනෙ සින්දුවම........"

ලස්සන කටහඬකින් සින්දුව කිව්ව අධීරා ගෞරද්ගෙ මනෝ ලෝකෙට බාදා කරේ අධීරාගෙ ප්‍රධානියා වුණ ජෙනරල් දනුක හේරත්.

"උඹ මෙතන සිංදු කියනවා.හෙට අර නඩුව මනුස්සයෝ..."

දනුක හෙට තියෙන්න නියමිත් නුවීනා ඒකනායකගෙ ඝාතන නඩුව ගැන අධීරාට මතක් කරත් අධීරාටනම් ඒ ගැන ගානක්වත් නැති පාටයි.

"කලබල වෙන්න එපා සර්...ඉදගන්නකෝ....ඒවා ඔක්කොම ගානට වෙලා තියෙන්නෙ"

අයිරා එයා ඉදන් හිටිය පුටුව දනුකට දීලා එයා ඊට ඉස්සරහින් තිබ්බ පුටුවට බර වුණේ මදිපාඩුවට කකුල් දෙකත් මේසෙ උඩින් තියාගන්න ගමන්.

"ඒ කියන්නෙ කෙල්ල ඒක විසඳුවා?"

අයිරා කරේ නෑ කියන්න ඔළුව වනලා ආපහු විසිල් කරන්න පටන් ගත්ත එක.දනුක ඇත්තටම හිතුවා මේ මොළේ වැඩි කෙනා මේ වෙද්දිත් මේ කේස් එක ඉවර කරලා ඇති කියලා.

"ඔය විසිල් කිරිල්ල පැත්තකින් තියලා වෙලා තියෙනදේ කියපන් යිර්!"

ඔන්න දනුකට පොඩ්ඩක් තරහා යද්දි විසිල් කිරිල්ලත් නවත්තලා කකුල් දෙකත් පහළට ගත්ත යිර් ටිකක් සීරියස් මූඩ් එකකට ආවා.

"තාම නෑ.බට් අද රෑ වෙද්දි මට දැනගන්න පුලුවන් මොකද්ද වෙලා තියෙන්නෙ කියලා."

"එතකොට පාටි එක?"

යිර් කරේ කට කොනට හිනාවෙන එක.අන්න එතකොටයි දනුකට තේරුණේ කවදාවත් තම උපන්දිනේට පාටි එකක් දාලා නැති යිර් ලංකාවම හෙල්ලිලා යන්න පාටි එක දාන්නෙ ඇයි කියලා.යිර් සාක්කුවෙන් ඇදලා ගත්ත ඉන්විටේෂන් එකක් දනුකට දික්කරා.

"අනිවා එන්න ඕනි සර්...මොකද අප්පච්චිත් ෆුල් හොල්මන්නෙ..."

ඇත්ත.රටේ අගමැති දුවණිය වුණහම ටිකක් නම්බුකාරව ඉන්න ඕනි.ඒත් තමන්ගෙ අප්පච්චිගෙ දැඩි විරෝදයත් එක්ක වුණත් ධීර් කරේ ආමි එකට ජොයින් වෙච්ච

03

එක.ධීර්ගෙ මොළේ කොච්චරද කිව්වොත් ධීර්ට තාම වයස 24ක් වුණත් දැන් එයා බුද්ධි අංශෙ කර්නල් කෙනෙක්.සාධාරණයි ඉතින්.

"සර් මොකද කිව්වෙ එකපාරටම බර්ත් ඩේ පාටි එකක් ගන්න ඕනි කිව්වම?"

දනුකට දැන ගන්න ඕනි වුණා අගමැති ශෙහාන් සූරියබණ්ඩාරගෙ රිඇක්ෂන් එක මොකද්ද කියලා.නාහට නාහන තමන්ට ඉන්න එකම දරුවා වුණ ධීර් එකපාරටම උපන්දිනේට පාටි එකක් දාන්න ඕනි කිව්වම මොන තාත්තාද ඉතින් පුදුම වෙන්නෙ නැත්තෙ.

"මුලින් සතුටු වුණා මට මොළේ පෑදිලා කියලා.බට් ප්ලෑන් එක කිව්වම නම් මට රටේ නැති සත්තුන්ගෙ නම් කියලා බැන්නා.හැමදාම වෙනදේනෙ ඉතින්,අවුලක්මත් නෑ..."

ධීර් කරේ ලාවට හිනාවුණ එක.ඔවු මේ පාටි එක තනිකරම ප්ලෑන් එකක්.ප්ලෑන් එකක් කියනවාට වඩා ප්ලෑන් ගොඩක් කියන එක තමයි හරි.මොකද ධීර්ට ඕනි හෙට නඩුවට කලින් මේකෙ මුල මැද අග හොයාගන්න.දැන් කේස් එකේ සීයට අනූවක් තොරතුරු හොයාගත්තත් ධීර් වගේම එයාගෙ සගයො දෙන්නාට මේ වෙලාවෙ ඕනි කරේ ඒවා පිළිවෙලකට හදාගන්න.ධීර් කතාවක් ගොඩනගාගෙන තිබුණත් ඒකද හරිම කතාව කියලා තහවුරු කරගන්න අද පාටි එක ඇරේන්ජ් කරා.

"අපේ අය ශේප්නෙ?"

ධීර් කරේ ඔවු කියන්න ඔළුව වැනුව එක.මොකද එයා වගේම දනුකත් දන්නවා එයාලට තමා හොඳම අය ඉන්නෙ කියන එක.

"හෙට නඩුවට කලින් ඕනි දේ හරියට වුණානම් එච්චරයි කෙල්ලේ...අපේ ලෝයර් කොහොමද?"

"නිෂාදි අවුලක් නැනෙ සර්..."



දනුක ඔවු කියන්න ඔළුව වැනුවා.මොකද නිෂාදි පෙරේරා කියන්නෙ ලංකාවම අඩු වයසකින් හොල්ලලා ගත්ත ලාබාල ලෝයර් කෙනෙක්.

"එහෙනම් සර් මන් එන්නම්...හය වෙද්දි එන්න සර්..."

දනුකටත් සැලුට් කරලා ධීර් කෙලින්ම ආවෙ කැම්ප් එකේ කා පාක් එකට.එයාගෙ කාර් එකට නැග්ග ධීර් කෙලින්ම ගියේ එයාගෙ සගයො දෙන්නා වෙච්ච අභිලාෂ් තේනුවරයි,ආදිත්‍ය රත්නායකයි බෝඩ් වෙලා හිටිය ගෙදරට.පවුල කියලා දෙයක් ඒ දෙන්නාට නැති වෙද්දි ධීර් වගේම දනුක කියන්නෙ ඒ දෙන්නාගෙ පවුල වුණේ මීට අවුරුදු ගානකට කලින් ඉදම්මයි.

බීප්.....බීප්.....බීප්.....

"මොකද්ද වීෆ්...හෝන් එක උඩ නැගගෙන ඉන්න එපා අප්පා... එකපාරක් හෝන් කරාම ගේට් එක අරිනවනෙ අනේ.ඔයාට එහෙම ගේට්ටුව අරින්නෙ නැතුව ඉන්නවද අපි?"

"අනෙ මගෙ කට..."

ගේට්ටුව අරින්න ආව ආදිත්‍යටත් පොඩි සද්දයක් දාපු ධීර් කෙලින්ම අවසරයකින් තොරවම ගේ ඇතුලට කඩා වැදුනා.මොකද එයාට මේ බෝඩිම නුපුරුදු තැනක් නෙවෙයි.

"මේ මොකද බර්ත් ඩේ ගර්ල් මෙහෙ?"

ඒ ඉතින් අභිලාෂ්.ඒ දෙන්නට තේ හදද්දි ධීර්ගෙ ෆෝන් එක ඇහුන නිසා ධීර්ටත් එක්කම තේ හදපු අභිලාෂ් ට්‍රේ එක සාලෙ තිබුණ ස්ටූල් එකෙන් තිබ්බෙ ධීර් පොඩි සෝෆා එකට වැටෙන අතරෙමයි.

05

"පාටි නෙවෙයි ඕයි...මේක වැරදුනොත් අපි ඔක්කොම ඉවරයි..."

අභිලාෂ් ධීර් ළඟින් ඉඳගනිද්දි ආදිත්‍ය ඒ දෙන්නාටම ඉස්සරහින් තිබුණ සෝෆා එකේ වාඩි වුණා.

"ඇත්ත...අර නවීනාත් අපහාස නඩුවක්ද මොකද්ද එකක් දාන්න ලෑස්ති."

ආදිත්‍යගෙ කතාවට ධීර් කරේ ඔවු කියන්න ඔළුව වනපු එක විතරයි. එහෙම නඩුවක් දැම්මත් ධීර්ට අවුලක් වෙන්නෙ නෑ.මොකද එයාගෙ අප්පච්චි අනිවාරෙන් බේරගන්නවා.ඒත් එයාගෙ සගයො දෙන්නාට අවුලක් වෙයිද කියන ප්‍රශ්නෙ ධීර්ගෙ හිතේ කොනක නැතුවාම නෙවෙයි.

"මතකනෙ ප්ලෑන් එක?"

"කෝකටත් ආපහු පාරක් කියන්න නේද?"

මෝඩ හිනාවක් දාගෙන හිටිය ආදිත්‍යටත් රවපු ධීර් කෝකටත් කියලා ආපහු ප්ලෑන් එක විස්තර කරන්න ගත්තා.

"ආදිත්‍ය නවීනාට එන කෝල් ගැන අවදානෙන් ඉන්න.අභිලාෂ්...නවීනාගෙ ගේ ඇතුල සර්ච් කරලා කොහොමහරි එයාගෙ සයින් එක හොයාගන්න බලන්න.ඒ වගේම නුවීනාගෙ සයින් එකත් හොයාගන්න.මන් හොයාගන්නම් ඉතුරුටික."

අභිලාෂ් වගේම ආදිත්‍ය හා කියන්න ඔළුව වැනුවා.

"ආ...."

06

ආදිත්‍ය ධීර්ගෙ තේකත් ධීර් අතට දීලා අභිලාෂ්ගෙ තේකත් අතට දුන්නා.

"කෝල්..."

වෙන කල්පනාවක හිටිය ධීර්ට ෆෝන් එක රින්ග් වෙනවා කියලාවත් පෙනුනෙ නැහැ.මොකද එයා හිටියෙ මනසින් එයා ගොඩනගපු කතාව ඇතුලට ගිහිල්ලා.

"හෙලෝ අම්මි?"

"කොහෙද බන් ඉන්නෙ?"

"මේ අම්මිගෙ නම්බර් එකනෙ?"

"නම්බර් එක කාගෙද කියලා වැඩක් නෑනෙ?කොහෙද ඉන්නෙ?"

"අභීලාගෙ ගෙදර ආවා."

"ඒකනායක ෆැමිලි එක පාටි එකට එන්න බෑ කියනවා."

"මොකක්?"

"ඔවු.නුවීනාගෙ පියුනරල් එක වෙලත් එච්චර කාලයක් නෑනෙ."

"අනේ මේ...මොකක් හරි කරලා ගෙන්නගන්න බලන්න අනේ...නැත්තන් ඔක්කොම විනාසයි.අර අභිංසකයාට ජීවිතේම

ජීරේ තමා ඉන්න වෙන්නෙ.අනික අවුරුදු තුනක් කියන්නෙ පොඩි කාලයක්ද?"

"හරි මන් මොකක් හරි කරන්න බලන්නම්..."

ආදිත්‍යවත් අභිලාෂ්ලාවත් මේ වෙන දේවල් ගැන මොකුත් අහන්න ගියේ නෑ මොකද එයාලාට කෝල් එක හොඳටම ඇහුනා.ඒ වගේම එයාලාගෙ වීෆ්ට මලපැනලා ඉන්නෙ කියලාත් ඒ දෙන්නාට තේරුණා.කොච්චර චිල් එකේ ඉන්න කෙනෙක් වුණත් ධීර් කියන්නෙ මලපැන්න වෙලාවට යකෙක් වගේ කෙනෙක් කියන්න මේ දෙන්නා අත්දැකීමෙන් දන්නවා.

"හවසට මීට් වෙමු."

බොන්න ගත්ත තේකත් පැත්තක දාලා වෙලාව බලන ගමන් ධීර් ආපහු ගියේ බන්ධනාගාරෙට.ඔවු ඒ එයාගෙ හොඳම යාලුවෙක් වෙච්ච රෙෂාන් මානවසිංහව මීට් වෙන්න.මේ ඝාතනයෙ මිනීමරුවා කියන ලේබල් එක එයාට වැදුනත් ඇත්තටම එයා නෙවෙයි මිනීමරුවා කියලා ධීර් දැනටමත් කන්ෆර්ම් කරගෙන ඉවරයි.

"කේෂව රාමනායක?"

බන්ධනාගාරෙට ඇතුල්වෙන තැන හිටිය පොලිස් ගාඩ් කෙනෙක්ට තමන්ගෙ අයිඩී එකෙ පෙන්නුව ධීර් මෙතන හිටිය එයා දන්න ලොකුම කෙනාගෙ නම කියලා ඇතුලට ගියා.

"දැන් අවුරුදු තුනක් ගිහිල්ලාත් තාම කේස් එක ක්ලෝස් වුණේ නැද්ද ධීර්?"

ධීර්ව රෙෂාන් ළගට එක්කන් යන්න ඉදිරිපත් වෙච්ච කේෂව ධීර්ගෙන් අහද්දි ධීර්ට හිනාවක් ගියා.මොකද එයාම තමයි ආපහු මේ කේස් එක ඕපන් කරේ.

"නැනෙ..."

කේෂව ධීර්ව රෙෂාන් හිටිය කූඩුව ළගට එක්කන් ඇවිල්ලා දොර ඇරලා දුන්නම රෙෂාන් මලානික හිනාවක් එක්ක ධීර් දිහා බැලුවා.

"හාරි රෙෂ්..."

ඔවු ඒක හරි ආදරණීය ආමන්ත්‍රණයක්. මොකද මේ ඉන්නෙ ධීර්ගෙ හොදම යාළුවෙක්.

"ධීර්..."

රෙෂාන් පැනපු ගමන් ධීර්ව හග් කරා.ඒක විනාඩියක් විතර දිග හග් එකක්.කේෂව එතනින් යන්න ගියේ මේ දෙන්නාට නිදහසේ කතා කරගන්න ඉඩ දීලා.මොකද කේෂව ඕනාවටත් වැඩිය ධීර්ව විශ්වාස කළා.

"මචං...හෙට නඩුව..."

ධීර් කරේ ඔවු කියන්න ඔළුව වනපු එක.වැඩි කතා බහක් නැති ධීර් මෙතනදිත් කරේ ඔලුව වනපු එක.

"ඇයි බං ආපහු මේ කේස් එක ඇදලා ගත්තෙ?"

"මොකද නියම මිණීමරුවව හොයාගත්ත නිසා........නෑ මන් සැක කරනවා මන් ඇත්ත මිනීමරුවාව හොයාගත්තා කියලා.මට කියපන් ඇත්තටම උඹද නුවීව මැරුවෙ?"

රෙෂාන් කරේ හිනාවෙච්ච එක.

"හිනාවෙන එක ඇත්තම උත්තරේ නෙවෙයි බං.ඇත්ත කියපං.මෙතන ඉන්න අනිත් උන් වගේ මං උඹව මරාගෙන කන්නෙ නෑ."

ඒත් රෙෂාන් කරේ හිනාවෙච්ච එක.ඔන්න ඉතින් ධීර්ගෙත් රතු කට්ට පනින්න ඉතාමත් ආසන්නයි.

"කියපං...."

රෙෂාන් ඇඳන් හිටිය ඇඳුමෙන් ඇදලා ගත්ත ධීර් රෙෂාන්ට ගහන්න ඇත ඉස්සුවත් රෙෂාන් කරේ ඇස් වල කඳුලු පුරවගත්ත එක.

"මං නෙවෙයි.මං කොහොමද මං ආදරේ කරන කෙනාගෙම අක්කාව මරන්නෙ?.."

ඔවු ඒක තමා ධීර්ට ඕනි වුණ උත්තරේ.

"උඹ හෙටත් ඔය උත්තරේම දීපන්.මං ඉතුරු ටික බලාගන්නම්."

ආපහු රෙෂාන්ව හග් කරලා ධීර් ගෙදර ආවෙ පාටි එකට ලෑස්ති වෙන්න.

"ඒකනායකලා එන්නම් කිව්වා.දැන් සතුටුද?"

ධීර් ගෙදර ආව ගමන් ශෙහාන්ගෙ උත්තරේ නිසා ධීර්ට ගොඩක් සතුටු හිතුනා.

"මන් හිතන්නෙ ඒක තමා මට ලැබිච්ච හොදම බර්ත් ඩේ ගිෆ්ට් එක."

ශෙහාන්වත් හග් කරපු ධීර් එයාගෙ රූම් එකට ගිහිල්ලා වෙලාව බැලුවා.

5.40

හෙට මේ වෙද්දි මේ සාතනයේ මිණීමරුවාව හොයාගෙන මේ හැමදේම ඉවර කරන්න පුලුවන් කියන සිතුවිල්ලත් එක්ක ධීර් අද දවසෙම තිබ්බ මහන්සිය වතුරට හෝදලා යැව්වා.මීට කලින් බර්ත් ඩේ පාටි එකක් ඇරන් නැති නිසා ධීර්ට පොඩි සතුටකුත් නැතුවාම නෙවෙයි.එයාගෙ අම්මයි අප්පච්චියි තෝරපු කලු පාට ට්‍රවුසර් එකයි,සුදුපාට ෂර්ට් එකයි ඇන්ද ධීර් කොට කොණ්ඩෙ පෝනිටේල් එකක් දාලා පහළට ආවෙ ඇවිල්ලා ඉන්න අයත් එක්ක කතාකරන්න හිතාගෙන.ඒ එද්දිත් ආදිත්‍ය,අභිලාෂ් වගේම දනුකත් ඇවිල්ලා හිටියා.මුලින්ම එයාලා ළගට ගිය ධීර් ලාවට තුන්දෙනා එක්කම හිනාවුණා.

"මන් මගේ වැඩේපටන් ඇරන් තියෙන්නෙ."

ආදිත්‍ය එයාපොඩ්ස් දෙකට තට්ටුවක් දාලා කියද්දි අභිලාෂ් ඇගිලි දෙකකින් සැලුට් එකක් දාන ගමන් ධීර්ගෙ ගෙදරින් එළියට ගියේ එයාගෙ රාජකාරිය කරන්න.

පාටිය පටන් ඇරන් පැයකට විතර පස්සෙ ධීර් ගියේ නවීනා ළගට.ඔවු එයා තමයි සාතනය වෙලා ඉන්න නුවීනා ඒකනායකගෙ නංගි.

"හායි නුවී-ඔහ්හ්හ්....අයිම් වෙරි සොරි නවී...සොරි..."



ධීර් කකුල පැටලිලා වැටෙන්න යනවා වගේ අධිතාත්වික රංගනයක් රගදක්වලා නවීනාගෙ උරහිසෙන් අල්ලගෙන වැටෙන්නෙ නැතුව බේරුණා.

"ඉට්ස් ඕනේ ධීර්...ආයු ඕකේ?"

"යස් නවී.තැන්ක් යූ.."

නවීටත් සමුදුන්න ධීර් ආපහු ආවෙ දනුකයි ආදිත්‍යයයි හිටිය තැනට.

"හරිද?"

දනුක ධීර්ගෙන් අහද්දි ධීර් කරේ හිනාවෙලා ඔලුව වනපු එක.

ධීර් හිටියෙ ටික්ක් බයවෙලා මොකද එයා ගෙනාව උපකල්පනේ වැරදීනම් මේ මුලු නඩුවම ආපහු රෙෂාන්ගෙ පැත්තට ඇදෙනවා.ඔවු දැන් මේ ධීර්ලා ඉන්නෙ උසාවියේ වාඩි වෙලා.ධීර්ට වඩා ලෝයර් නිෂාදි බයවෙලා ඉන්නෙ.

"නුවීනා ඒකනායක සාතන නඩුව දෙවන වර කියවීම."

විනිසුරුවරයා නිෂාදි දිහා බලද්දි නිෂාදි විනිසුරුවරයාට ඔළුව වනලා එයාගෙ ජොබ් එක පටන් ගත්තා.

"යුවර් ඕනර්...ගරු ස්වාමීනි...මගේ සේවාදායකයා වෙන රෙෂාන් මානවසිංහ මේ මිණීමැරුම කරේ නෑ කියන්න ප්‍රමානවත් සාක්ෂි ලැබිලා තියෙනවා ගරු ස්වාමීනී."

12

"ඒ මොනවද?"

"මන් මේ නඩුව බාරව හිටිය බුද්ධි අංශ නිලධාරියාව කැදවනවා."

නිෂාදි ධීර්ට එන්න කියලා සිග්නල් කරද්දි ධීර් ඇවිල්ලා විත්ති කූඩුවට නැග්ගා.ඇත්ත කියන බවට දිවුරුම් දීමෙන් පස්සෙ නිෂාදි මුලින්ම කතා කරා.

"ගරු ස්වාමීනී මැය තමයි හමුදා බුද්ධි අංශ කර්නල් අධීරා ගෞරද් සූරියබණ්ඩාර."

සූරියබණ්ඩාර නම ඇගෙද්දි විනිසුරු පවා ධීර් දිහා හැරිලා බැලුවා.මොකද කවුරුත් විශ්වාස කරන්නෙ නෑ අගමැතිගෙ දුව ආමි එකේ ඉන්නවා කියන එක.නිෂාදි ධීර්ගෙන් ප්‍රශ්න කරන්න පටන් ගත්තා.

"ඔබට ඇයි මේ නඩුව නැවත විවෘත්ත කරන්න හිතුනෙ?"

"මගේ ප්‍රධානියාගෙන් තමයි මට අණ ලැබුනෙ."

"හොදයි,කවුද ඔබගෙ ප්‍රධානියා"

"ජෙනරල් දනුක හේරත්"

"ඔබ මේ නඩුව ගැන හොයාගත්ත හැම දෙයක්ම ඉදිරිපත් කරන්න දැන් ඔබට අවස්තාව තියෙනවා."

"අවසරයි ගරු ස්වාමීනී,මම මේ නඩුව බාරගනිද්දි ඝාතනය වෙලා අවුරුදු තුනකටත් ළගයි.මම මුලින්ම ගියේ ඒ ඝාතනයෙන් පස්සෙ වහලා දාලා තිබුණ නුවීනා ඒකනායකගෙ ගෙදරට.ඒ ගෙදරින් මට හොයාගන්න ලැබුනෙ චිත්‍ර කීපයක් විතරයි.ඒවත් නුවීනා ඒකනායක ඇදපු ඒවා.ගරු ස්වාමීනි,මම ඊටපස්සෙ නවීනා ඒකනායකගෙන් ප්‍රශ්න කරා.මේ ඝාතනය වෙලා තියෙන්නෙ 2023 දෙසැම්බර් 21වෙනිදා.රෑ 8.00ත් 8.30ත් අතර කාලයේදි.නවීනා වගේම නුවීනා බෝඩ් වෙලා හිටියෙ එකම බෝඩිමක.මේ ඝාතනය වුණ දවසෙ නුවීනාගෙ පෙම්වතා වෙච්ච රෙෂාන් මානවසිංහ 7.45ට වගේ බෝඩිමට එනවා බෝඩිමේ අයිතිකාරිය දැකලා තියෙනවා.රෙෂාන් මානවසිංහ එන්න කලින් නවීනා ඒකනායක එයාගෙ පෞද්ගලික ගෙදර තිබුණ නුවර යන්න පිටත් වෙලා තියෙනවා බෝඩිමේ අයිතිකාරයා දැකලා තියෙනවා ගරු ස්වාමීනී, ඒවගේම රෙෂාන් මානවසිංහ 8.10ට වගේ ගෙදරින් පිටවෙලා යනවා සීසීටීවී දර්ෂන වල පැහැදිලිව සටහන් වෙනවා ගරු ස්වාමීනී.ඒනිසා මේ ඝාතනයේ ප්‍රධාන සැකකරු වෙන්නෙ රෙෂාන් මානවසිංහ."

ධීර් එයාගෙ කතාව ටිකකට නවත්තලා නිෂාදි දිහා බැලුවා.

"අන්න එහෙමයි ගරු ස්වාමීනී රෙෂාන් මානවසිංහ මේ ඝාතනය කරා කියලා සිරගත කරේ."

"ඔහු තමයි මේ ඝාතනය කරේ කියලා පිලිඇරන් තියෙනවා ගරු ස්වාමීනි"

අනිත් පාර්ෂවයෙ ලෝයර් කතාව මැද්දෙන් පනිද්දි ධීර් කාටවත් නෝටි නොවෙන්න එයාට රැව්වා.

"තවම කතාව අවසන් නැහැ ගරු ස්වාමීනී."

"ඔබ කරගෙන යන්න..."

"ස්තූතියි ස්වාමීනී,අදීරා ගෞරද් ඒ පැවසුවේ කලින් විමර්ෂන වල කරුණු.දැන් අපි මේ විමර්ෂනයෙ කරුණු වලට යොමු වෙමු ගරු ස්වාමීනී.අයිරා..."

නිෂාදි කතාව නවත්තද්දි ධීර් කතාව කියන්නපටන් ගත්තා.

"එදා නුවීනාගෙ ගෙදරින් හොයාගත්ත චිත්‍ර වල එයාගෙ සයින් එක ගහලා තියෙනවා ගරු ස්වාමීනි.ඒ වගේම නවීනා මීට සතියකට කලින් අත්සන් කරපු ඇග්‍රිමන්ට් එකක සයින් එකත් තියෙනවා ගරු ස්වාමීනී.ඔබම ඒක බලන්න.දෙන්නෙක් ගහපු අත්සන එකම වගේ වුණේ කොහොමද කියන එක ගැන තව වතාවක් අපි කල්පනා කරලා බලන්න ඕනි ගරු ස්වාමීනී.මොකද ඒ අත්සන් දෙකම එකක්.නමුත් අත්සන් කළ පුද්ගලයො දෙන්නා දෙන්නෙක්.එතනින් එහාට ගියාම ගරු ස්වාමීනී තමන්ටම කියලා වාහන තියාගෙන ඇයි එදා නවීනා ඒකනායක පාරෙ බස් එකේ ගෙදර ගියේ.මොකද එයාට ඕනි වුණා එයා නුවර ගියා කියලා ඔප්පු කරන්න.නමුත් ඇය බස් හෝල්ට් එකට ගිහිල්ලත් බස් තුනක් මගැරලා තමයි නුවර බස් එකකට නැගලා තියෙන්නෙ.මොකද්ද හේතුව?ඇයට පැය බාගයක් හොදටම ඇති නේද ගරු ස්වාමීනී මිනීමැරුමක් කරලා ආපහු නුවර යන්න.අපි එදා 9.30 බස් එකේ ගියපු මිනිස්සුන්ගෙන් අහද්දි එක මනුස්සයෙක් දැකලා තියෙනවා නවීනා ඒකනායකගෙ ස්කාෆ් එකේ ලේ පැල්ලමක් තියෙනවා.ඒවගේම මේ බෝඩිමේ සීසීටීවී තියෙන්නෙ පාරෙන් එක පැත්තකට විතරයි.නමුත් අනිත්පැත්තෙ පාරෙනුත් බෝඩිමට එන්න පුලුවන්.ඒපාර කෙලින්ම සම්බන්ද වෙන්නෙ බස් හෝල්ට් එකට.දැන් හැමදේම පැහැදිලියි නේද ගරු ස්වාමීනී?"

විනිසුරු පවා හිටියෙ මේ වෙන්නෙ මොනාද කියලා තේරුම් ගන්න බැරුව.

"ඇයි නවීනා ඒකනායක තමන්ගෙම නංගිව මරන්නෙ?"

අනිත් පාර්ෂවේ ලෝයර් අහද්දි ධීර් කරේ කට කොනට හිනාවුණ එක.

"හේතුව ආදරය කිව්වොත් මේ සභාව විශ්වාස කරයිද ගරු ස්වාමීනි?"

කට්ටියම හිටියෙ පුදුම වෙලා අඩුම රෙෂාන් පවා හිටියෙ පුදුම වෙලා.මොකද රෙෂාන් හිතුවෙ නැහැ එයා උපකල්පනේ කරපු එක හරි ඇති කියලා.

'ඒ කියන්නෙ ඒක ඇත්තක්.... නුවීත්?'

රෙෂාන්ගෙ හිත ඇතුලෙන් කිව්වෙ එක දෙයක් විතරයි.ඒ 'නුවීත්?' කියන එක.ධීර් කියන්නෙ තමන් හොයාගත්ත හැමදේම අනිත් අයට කියන කෙනෙක් නෙවෙයි.අනිත් එක ධීර්ට රෙෂාන් එක්ක වගේම මැරුණ නුවීනා ඒකනායක එක්කත් පෞද්ගලික සම්බන්ද කමක් තියෙනවා.මොකද මේ හැමෝම ධනපති පන්තියේ අයනෙ.

"මේක තනිකරම ගොතපු කතාවක් ගරු ස්වාමීනී."

අනිත් පාර්ෂවේ මේකට විරුද්ද වෙද්දි ධීර් කරේ නිෂාදි දිහා බලපු එක.

"නමුත් ස්වාමීනී තව දෙයක් තියෙනවා. හැමෝම පුදුම වෙයි තව දෙයක් දැනගත්තොත්.අධීරා?"

"මේ නවීනා ඒකනායක කියන්නෙ ඇත්තටම නුවීනා ඒකනායක.ඇත්තටම මැරිලා ඉන්නෙ නවීනා ඒකනායක. සර්වසම නිවුන්නු වුණත් මේ දෙන්නාගෙ බ්ලඩ් ගෲප් එක වෙනස්. නවීනා ඒකනායකට තියෙන්නෙ ඒ පොසිටිව් බ්ලඩ්.නමුත් නුවීනාට තියෙන්නෙ ඒබී පොසිටිව් බ්ලඩ්.දැන් වුණත් බ්ලඩ් ටෙස්ට් එකක් කරොත් ඔප්පු වෙනවා මේ ඉන්නෙ නුවීනා ඒකනායක කියලා.මොකද මේ නවීනා ඒකනායකගෙ නම ඇරන් ඉන්න නුවීනා ඒකනායකට තියෙන්නෙ ඒබී පොසිටිව් බ්ලඩ්!"

"නඩු විභාගය පැයබාගෙකට කල් දානවා."

මේ වෙන දේවල් ගැන තමන් තව වතාවක් හිතන්න ඕනි කියලා හිතුව විනිසුරු නඩුව පැයබාගෙකට කල් දාලා විනිසුරු එතනින් යද්දි නවීනා කෙලින්ම ආවෙ ධීර් ලගට

"මොකද ධීර් මේකෙ තේරුම?"

"මේක තමා ඇත්ත.ඒක ඔයත් පිලිගන්නවානෙ නුවී...."

"මම නුවී නෙවෙයි මනුස්සයෝ..මම නවී...තමුසෙට මාව අදුරගන්න බැරිද?"

ධීර් නවීනාව ගනන් ගන්නෙ නැතුව එතනින් එළියට ගියා.

"නවීනා ඒකනායක?"

නවීනා විත්ති කූඩුවට නැග්ගම එයා ළගට ආවෙ නිෂාදි.

"ඇයි තමන්ගෙම අක්කාව මැරුවෙ?"

නවීනා කරේ වචනයක්වත් නොකියා හිටිය එක.

"ඒ කියන්නෙ තමුනුයි තමන්ගෙ අක්කාව මැරුවෙ?"

ආපහු නවීනා කතා නැහැ.

"නවීනා."

"මං නවීනා නෙවෙයි.නුවීනා ඒකනායක. මමයි මගේ නංගිව මැරුවෙ"



නවීනාගෙ එහෙමත් නැත්තම් ඇත්තම නුවීනාගෙ සද්දෙ වැඩි වෙද්දි මුලු උසාවියම නිහඬ වුණා.කාටවත් කතා කරන්න උවමනාවක් තිබුණෙ නැහැ.

"මායි නංගියි සර්වසම නිවුන්නු.මගේ නංගිට් ඒ කියන්නෙ නවීනාට තමයි ඇත්තටම රෙෂාන් ආදරේ කරේ.ඒත් මාත් රෙෂාන්ට කැමැත්තෙන් හිටියා.නංගිට ඕනි වුණේ ආටිස්ට් කෙනෙක් වෙන්න.ඒත් තාත්තා එයාගෙ හැම බිස්නස් එකක්ම නංගිගේ නාට ලිව්වා.මට ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ.ඒත් රෙෂාන්?.ඉතින් මං එයාව මැරුවා.රෙෂාන් ආවෙ නංගිව මීට් වෙන්න.රෙෂාන් එන්න කලින් මං බෝඩිමෙන් ආවෙ නුවර එනවා කියලා.ඊටපස්සෙ ආපහු අනිත් පාරෙන් ඇවිල්ලා රෙෂාන් යනකල් බලන් ඉදලා ආපහු බෝඩිමට ආවා.නංගියි රෙෂානුයි රණ්ඩු කරලා.ඉතින් මට ඒකෙන් පොඩි සතුටක් ඇතිවුණා.මන් නංගිව මරලා නංගි වගේ හැසිරුණා.රෙෂාන් ඇරෙස්ට් කරා කියලා දැනගත්තත් මට එයාට උදව් කරන්න විදිහක් තිබ්බෙ නෑ.ඒත් මං එයාට ආදරෙයි.මට තිබ්බෙ නංගි ගැන තරහක්.මට රෙෂාන්ව ඕනි වුණා.එයා වෙන කෙනෙක් එක්ක හිටියානම් මං හිත හදාගන්නවා.ඒත් මගේ නංගිම?මං නංගිව මැරුවා.නංගි වගේ මාස කීපයක් රෙෂාන් එක්ක සතුටෙන් හිටියා.ඒත් රෙෂාන්ව ඇරෙස්ට් කරාම මට කරන්න දෙයක් තිබ්බෙ නෑ.ආපහු මේ කේස් එක ඇද්දොත් මාව අහුවෙනවා කියලා මං දැනන් හිටියා. මට සමා වෙන්න රෙෂාන් මං ඇත්තටම ඔයාට ආදරෙයි."

ඒක තමා නුවීනාගෙ ඇත්තම පාපෝච්චාරණය.ආදරේට කරන්න බැරි දෙයක් නෑ කියලා කියනවානෙ.මේකත් ඒකට එක උදාහරණයක්.

"මෙතෙක් කල් ඝාතකයා වුණ රෙෂාන් මානවසිංහව නිදොස් කොට නිදහස් කරන අතර නිවැරදි ඝාතකයා වුණු නුවීනා ඒකනායකව ජීවිතාන්තය දක්වා බරපතල වැඩ සහිතර බන්ධනාගාරගත කරනු ලබනවා."

විනිසුරුගෙ නියෝගයත් එක්ක රෙෂාන්ට දාලා තිබුණ මාංචු ගැලවිලා යද්දි නුවීනාව විත්ති කූඩුවෙන් බැස්සුවෙ කාන්තා පොලිස් නිලධාරිනියක්.

**"මට සමාවෙන්න රෙෂාන් මං ඔයාට ඇත්තටම ආදරේ කළා!!!."**

තමන්ටම කියාගත්ත නුවීනා පොලිස් නිලධාරිනියගෙ ඉනේ රදවලා තිබුණ තුවක්කුව අරන් ලෝඩ් කරේ වෙන්න යනදේ තප්පර ගානකින් තේරුම් ගත්ත ධීර් ඒපැත්තට දුවන් යද්දි.

ඩෝං......

"එපා....."

ධීර්ගෙ කටහඬ වගේම වෙඩි සද්දෙත් මුලු උසාවියපුරාම දෝංකාර දුන්නා. ඉතිහාසයේ පළවෙනි වතාවට විත්ති කූඩුව ලේ වලින් නැවිලා යද්දි,රෙෂාන් කරේ අසරනව නුවීනා දිහා බලන් හිටිය එක.ඇත්තටම නොවුණත් ඒ හිටියෙ එයා ආදරේ කරපු කෙනාගෙ රූපෙ.ඉතින් ධීර් කරේ නුවීනා ඒකනායක දිහා තප්පර ගානක් බලන් ඉදලා ආදිත්‍ය එක්ක වගේම අභිලාෂ් එක්ක උසාවියෙන් එළියටාඅව එක.මොකද එතන ඉදන් හැමදේම ඩීඅයිජී රමේශ් සුබසිංහ බලාගන්නවා.

මෙන්න දැන්ලැබුණ විශේශ පුවතක්.

වසර තුනකට පෙර ඝාතනයට ලක් වුණු නුවීනා ඒකනායකගේ නඩුව නැවත කැඳවූ අවස්තාවේදී නිවැරදි ඝාතකයාව සොයාගෙන ඇති අතර ඉතිහාසයේ පළමු වතාවට විත්ති කූඩුව ලේ වලින් අපිරිසිදි වී ඇත. නැවතත්වෙම ප්‍රවෘත්තිය.....

මේ පිලිබද තවත් තොරතුරු සමගින් ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශයෙන් මුණගැහෙමු.

ධීර් හිටියෙ පුරුදු විදිහටම දනුකගෙ ඔෆිස් එකේ.අභිලාෂ් වගේම ආදිත්‍යත් ධීර්ට එහාපැත්තෙන් ඉදන් හිටියෙ සිද්දිය වෙලා සතියකට පස්සෙ.එදා බර්ත් ඩේ පාටි එකේදි

ධීර් කරේ නුවීනාගෙ උරහිසේ විතරක් තියෙන උපන්ලපේ ඇත්තටම නුවීනාගෙ එහෙමත් නැත්තන් ඒ වෙලාවෙ නවීනා විදිහට පෙනීහිටිය නුවීනාගෙ උරහිසේ



තියෙනවද බලපු එක.ඔවු ඒ උපන් ලපේ තිබුණා.අන්න එතනින් තමා ධීර් මේ කේස් එක සම්පූර්නයෙන්ම විසඳුවේ.ඒ වගේම අභිලාෂ් නුවීනාගෙ ගෙදරට ගිහිල්ලා හොයාගත්ත සික්නේචර් එකෙන් හැමදේම පැහැදිලි වුණා.ඒ වගේම ආදිත්‍ය නුවීනාගෙ කෝල් ට්‍රැක් කරාම හොයාගත්තෙ නුවීනාට කතා කරේ කවුරුවුණත් එයා මුලින්ම කිව්වෙ නුවී කියලා.පස්සෙ තමයි නවී කියලා කතා කරේ.ඔන්න ඔහොමයි ධීර්ගෙ ටීම් එක මේ එක විසඳුවේ.

"කොහොමද ධීර් දැනගත්තෙ නුවීනාත් රෙෂාන්ට කැමැත්තෙන් හිටියා කියලා."

"ඉස්සර රෙෂාන් තමා කිව්වෙ නුවීනාත් කැමැත්තෙන් ඉන්න ඇති කියලා.බට් ඒක ගෙස් එකක් විතරයි.ඒක වැඩක් නෑ.නවීනාට යුක්තිය ඉෂ්ට වුණානෙ."

කට්ටියම ඔලුව හොල්ලද්දි දනුක විතරක් ධීර් දිහා බැලුවා.

"ඒත් වැරදිකාරයෙක් නැනේද?"

ධීර් කරේ කට කොනේ හිනාවෙලා නෑ කියන්න ඔළුව වනපු එක.

***"එහෙනම් මේපාර අපි ආදරය කිරීමේ වරදට ප්‍රේමය එල්ලීම් ගස් යවමු... "***

දනුක එයාගෙ හොඳම ගෝලයා දිහා බලන් හිටියෙ ලොකුම ලොකු ආඩම්බරයක් එක්ක.

ධීර් නම් ඉන්නෙ හොඳටම තරහා ගිහිල්ලා.මාස තුනක් ලංකාවෙන් පිට වෙලා ඉඳලා ට්‍රේනින් එකත් ඉවර කරලා දැන් මේ ලංකාවට ආවෙ ටිකක් නිදහසේ ඉන්න කියලා වුණත් තමන්ව ගන්න එනවා කිව්ව කෙනා තාම නැති නිසා එයාපෝට් එකෙන් එළියට වෙලා ධීර් මේ ඉන්නෙ හොඳටම මල පැනලා.

"තාම ආවෙ නැද්ද?"

"හදිස්සි වෙන්න එපා ධීර්..."

"මන් මෙතන පැය බාගයක් ඉන්නවා මෝඩයෝ."

"හරි හරි....පිටිපස්ස බලන්න."

ඔන්න එතකොට තමයි අභිලාෂ්ට බැන බැන හිටිය ධීර් එයාගෙ පිටිපස්ස බැලුවෙ.

"මෝඩයා...."

හොඳවැයින් අභිලාෂ්ට රවන ගමන් ධීර් කරේ අභිලාෂ්ව හග් කරපු එක.

"කොහොමද ඉතින් ට්‍රේනින් එක?"

ධීර්ගෙ අතක් එක්ක තමන්ගෙ අත පටල ගන්න ගමන් අභිලාෂ් ඇහුවෙ මදිපාඩුවට ධීර්ගෙ එක බෑග් එකකුත් ඇරන්.



"අවුලක් නෑ ෂේප්..."

ෂේප් වෙන්න බෑ.මොකද ධීර් මේ මාස තුනට තවත් ටිකක් ඇදිලා ගිහිල්ලා.ඉස්සර කිලෝ පනස් හතරක් හිටිය ධීර් දැන් ඇත්තෙ කිලෝ පනහක් වගේ කියලා තමයි අභිලාෂ්ට හිතුනෙ.

"බර කීයද?"

"අඩුවෙලා අප්පා...හතලිස් නවයයි."

ධීර් මේ වෙලාවෙ පොඩි එකෙක් වගේ හැසිරුණාට තරහා ගිහිල්ලා ඉන්න වෙලාවට යකෙක් වගේ කියලා ධීර් වටේ ඉන්න හැමෝම වගේ දන්නවා.

"ආපහු ජිම් එක පැත්තෙ යන්න වෙයි එහෙනම්."

"අනේ මනුස්සයෝ...අර ක්‍රිෂෝර් කාරයත් මාව මරාගෙන කෑවා.දැන් ඔයත් හදන්නෙ මාව තව ටිකක් මරන්න."

අභිලාෂ් තනියම හිනාවුණේ ඇයි කියලා දන්නෙ ඉතින් එයාම විතරයි.

"තනියෙන් හිනාවෙන්නෙ?මටත් කියන්න මාත් හිනාවෙන්නම්"

අභිලාෂ් ධීර්ගෙ ඔලුවට පොඩි තට්ටුවක් දාලා කාර් එකේ දොර ධීර්ට ඇරල දුන්නා.

22

"තැන්ක්ස්..."

කාර් එකට නැග්ග ගමන් දනුකගෙන් ආව කෝල් එක නිසා ධීර්ට හිතුනෙ ඉන්දියාවෙ හිටියානම් හොදයි කියලා.ඇයි අනේ ලංකාවට ඇවිල්ලාත් ටිකක් නිදහසේ ඉන්න නැනෙ.

"කියන්න සර්."

"ගොඩබැස්සාද?"

"ඔවු සර්.දැන් ටිකක් වෙලා"

"මහන්සි බව දන්නවා.ඒත් කෙලින්ම ඔෆිස් එකට එන්න."

"මොකද්ද සර් කේස් එක?"

"බෑන්ක් රොබරි එකක්."

"කොහෙද?මොන බැන්ක් එකද?"

"බෑන්ක් හයක්.එකම දවසෙ."

"හරි අපි එන්නම්."

## 23

"ඉක්මනට එන්න.බට් දැන් ලොකු ට්‍රැෆික් එකක් ඇති."

"ඕකේ සර්."

කෝල් එක කට් වෙලා යද්දිම අභිලාෂ් කාර් එකට නැග්ග නිසා ධීර් කරේ මූණත් නරක් කරගෙන එයා දිහා බලපු එක.

"කෙලින්ම ඔෆිස් එකට යමු."

හේතුවක් අහන්නෙවත් නැතුව හා කියන්න ඔළුව වනපු අභිලාෂ් වාහනේ එයාපෝට් එකෙන් එළියට දැම්මා.ධීර්ට ඒකට හේතුව හිතාගන්න බැරි වුණා.

"ඇයි කියලාවත් අහනවකො...."

අභිලාෂ් කරේ හිනාවෙන එක.

"දැන් ඉතින් ලොක්කාගෙ පෝස්ට් එකට මාරු වෙලානෙ.ඉතින් ලොක්කා කියන එක අහන්න ඕනි."

මේ වගේ මෝඩයෙක් කියලා හිතන ගමන් ධීර් කරේ ආදිත්‍යාට 'අපි එනගමන්' කියලා මැසේජ් එකක් දාපු එක.මේ වෙලාවෙ තමයි අභිලාෂ් දැක්කෙ ධීර්ගෙ දකුණු අතේ වැලමිට ළඟ බැන්ඩේජ් කරලා තියෙනවා කියලා.මොකද මේ වෙලාවෙ තමයි ධීර් ඇදන් හිටිය ෂර්ට් එකේ අත් නමාගත්තෙ.

"මොකද වුණේ?"

ධීර් කරේ මෝඩ පහේ හිනාවක් දාපු එක.

"අධීරා?"

ධීර් දන්නවා අභිලාෂ් එයාගෙ සම්පූර්ණ නම කියන්නෙ මලපනින්න ඔන්න මෙන්න තියෙද්දි කියලා.මොකටද ඉතින් ඒ අසරණයාගෙ ප්‍රෙශර් නග්ගන්නෙ.

"කැපුනා අනේ කැපුනා...ඕක මහ දෙයක් නෙවේනෙ ඔච්චර තරහා ගන්න....මං තරහයි වදේ...."

බුම්මගෙන අහක බලාගත්ත ධීර් දිහා අභිලාෂ් බලන් හිටියෙ නිනාවෙලා.ඒකට හේතුව ධීර්ට අහන්න ඕනි වුණත් දැන් තමයි තමන් අභිලාෂ් එක්ක තරහා වුණේ කියලා මතක් වෙච්ච නිසා ධීර් කට පියාගෙන හිටියා.

"අපි ආවා."

"මගෙත් ඇස් පේනවා."

අභිලාෂ්ට ආපහු සැරයක් රවලා ධීර් කෙලින්ම ගියේ දනුකගෙ ඔෆිස් එකට.ඒ යද්දිත් ආදිත්‍ය ලැප් එකට එබීගෙන හිටිය නිසා ධීර් හිතුවා යම්තාක් දුරකට තොරතුරු ටිකක් හොයාගෙන ඇති කියලා.

"මොනාද හොයාගත්තෙ?"



ධීර් ආදිත්‍යට එහා පැත්තෙන් ඉඳගන්න ගමන් එයත් ලැප් එකට එබුණා.

"සීසීටීවී ෆුටේජස් විතරයි...බලන්නකො."

ආදිත්‍ය ලැප් එක සම්පූර්නයෙන්ම ධීර්ගෙ පැත්තට හැරෙව්වා.ඒ දර්ශනය දිහා අවදානෙන් බලන් හිටිය ධීර් ආපහු හැරුනෙ ආදිත්‍ය දිහාට.

"වාහන වල නම්බර් ප්ලේට් නැද්ද?"

"එකක තිබුණා.බට් ඒක උස්සපු වාහනයක් වීෆ්."

ධීර් දැන් කල්පනා කරේ මේ මොන මරාලයක්ද මේ කඩන් පාත් වුණේ කියලා.මොකෝ නම්බර් ප්ලේට් එකක්වත් නැතුව කොහොමද හොරු අල්ලන්නෙ.

"මේ හැන නිදහසේ හොයන්න කෙල්ලේ..."

දනුකට තේරුණා ධීර් ඉන්නෙ අමාරුවෙන් කියලා.ඒ නිසාමයි දනුක කිව්වෙ නිදහසේ මේක හොයන්න කියලා. දනුකටත් සැලුට් කරලා දෙන්නාම ධීර්ගෙ සුපුරුදු ඔෆිස් එකට ආවා. ඒ එද්දිත් අභිලාෂ් ඔලුව මේසෙ උඩ තියාගෙන හිටිය නිසා ආදිත්‍ය අභිලාෂ් දිහයි ධීර් දිහයි මාරුවෙන් මාරුවට බැලුවෙ එකපාරටම වෙච්ච විපර්යාසෙ මොකද්ද කියලා.

"සම්පූර්ණ ෆුටේජස් ටික මගේ ටැබ් එකට දාන්න ආදි."

හා කියන්න ඔලුව වනපු ආදිත්‍ය අභිලාෂ්ට එහාපැත්තෙ පුටුවෙන් වාඩි වෙලා අදාල තොරතුරු ටික ධීර්ට දැම්මා.

26

"බඩගිනී නේ?".

ධීර්ගෙ බඩ කැගහන සද්දෙ ඇහිච්ච නිසාමද මන්දා අභිලාෂ් ආදිත්‍යගෙන් ඇහුවා බඩගිනීද කියලා.ප්‍රශ්නෙ අහන්න ඕනි ධීර්ගෙන් වුණත් දෙන්නා තරලා වෙලානෙ ඉන්නෙ.

"ඔවු මචං දැන්නම් බඩගිනි.... මොනාහරි කමුද?චීෆ්...?"

ධීර් කරේ හා කියන්න ඔලුව වනපු එක.ඒකත් ටැබ් එකට එබී ගෙනමයි.

"මං ඇරන් එන්නම්."

අභිලාෂ් යන්න යද්දි ධීර් අභිලාෂ් යන දිහා බලාගෙන අභිලාෂ්ට රැව්වා.

"මොකෝ චීෆ් වුණේ?"

"යාලුවාගෙන්ම අහගන්න එකයි ඇත්තෙ."

ආදිත්‍යටත් කැගහලා ධීර් ආපහු වීඩියෝස් ටික බලන්න ගත්තා.විනාඩි පහකින් විතර අභිලාෂ් ආපහු ආවෙ පේස්ට්‍රි එක්ක කොෆී තුනක් අරගෙන.ඒකත් කාලා මේ වීඩියෝස් ටික බලලා වැඩක් නෑ කියලා තේරුම් ගත්ත ධීර් වොෂ් එකක් දාගෙන එන්න ගෙදර යන්න ලෑස්තිවුණා.

"මං ගෙදර ගිහිල්ලා විනාඩි පහළවෙන් එන්නම්."

27

"ඕකේ චීෆ්..."

"ගෙනාවා වගේම ගිහින් දානවානම් හොඳයි."

ධීර් ඔය නොකියා කිව්වෙ අභිලාෂ්ට ගිහින් දාන්න කියලාලුනෙ. කාට කියන්නද ඉතින් මේ රණ්ඩු.

"යමු."

දෙන්නම ගෙදර යන්න කැම්ප් එකේ කාර් පාක් එකට ආවා.ඒ ඇවිල්ලා කාර් එක පාක් එකෙන් එළියට දාන ගමනුත් ධීර් කරේ ටැබ් එක දිහා බලන් හිටිය එක.

"තාම තරහද?"

"නෑ නෑ....කෑම වටිනවා තරහට වඩා."

පරාජය පිලිගත්ත ධීර් හිනාවෙලා කියද්දි මෙච්චරවෙලා මැලවිලා තිබ්බ අභිලාෂ්ගෙ මූණටත් එළියක් වැටුණා.අනේ ඉතින්,ධීර් දන්නෙ නෑනෙ අභිලාෂ් තකහනියක්ම ගිහින් ධීර් කන්න ආසම වර්ගයේ ප්‍රේස්ට්‍රි අරන් ආවෙ ධීර්ව යාළු කරගන්න කියලා හිතාගෙනමයි කියලා.

"හරිනෙ...මේ තියෙන්නෙ බඩු."

ධීර් මොනා කියවනවද කියලා වත් අභිලාෂ්ට තේරුණේ නැහැ.ඒත් එක්කම ධීර් කෙලින්ම කෝල් එකක් ගත්තෙ ආදිත්‍යට.

"කියන්න චීෆ්."

"මන් එව්ව ෆොටෝ එකේ තියෙන නම්බර් ප්ලේට් එක ගැන බලන්න."

"මේ බයික් එකක්නෙ චීෆ්."

"තමුසෙ ඔය වීඩියෝ ටික හරියට බැලුවා නම් පේන්න ඕනි ඔය බයික් එක හැම බැන්ක් එකක් ඉස්සරහම නවත්තලා තියෙනවා කියලා."

"සිරාවටම?මට ඕක පෙනුනෙ නැනෙ."

"අන්න ඒ නිසා තමයි තමුසෙ ලෙෆ්ටිනට් වෙලා ඉදලා මන් කර්නල් වුණේ.දැන් ඒ බයික් එක ගැන හොයන්න.මන් තව විනාඩි දහයකින් එනවා."

ආදිත්‍ය එක්ක කතා කර කර ඉද්දිම ගේ ළගට ඇවිල්ලා තියෙද්දි අභිලාෂ්ට එන්න කියන ගමන්ම ධීර් කරේ උඩ තට්ටුවේ එයාගෙ රූම් එකට ගිය එක.

"අපේ එක්කෙනා ආවද පුතා?"

"ඔවු සර්."

29

පාලිමන්ට් එකේ ඉදන් ගෙදර ආව ශෙහාන්ට දකින්න ලැබුනෙ සෝෆා එකේ ඉදගෙන ඉන්න අභිලාෂ්ව.

"අර බැන්ක් රෙබරි එකේ වැඩේ මොකද පුතා.?විපක්ෂෙ අය පාර්ලිමේන්තුව දෙක කරා අද."

ශෙහාන් අභිලාෂ්ට එහාපැත්තෙන් ඉදගන්න ගමන් අභිලාෂ්ගෙ කරට අතකුත් දාගත්තා.

"ඒක රෑ වෙද්දි විසදෙයි සර්."

"ඔය සෑර් ගෑවිල්ලත් නවත්තන්න වෙයි."

සර් කියන වචනෙ නෝන්ඩියට වගේ කිව්ව ශෙහාන් අභිලාෂ්ගෙ උරහිසටත් තට්ටුවක් දාන ගමන් එයාගෙ රූම් එකට ගියා.

"යමු..."

කළුපාට ට්‍රවුසර් එකකට සුදුපාට අත් දිග ෂටර් එකක් ඇදලා ඒකෙ අත් වැලමිට ළගට නවලා බූට් දෙකකුත් දාගෙන ආව යීර් අභිලාෂ්ට යන් කියද්දි අභිලාෂුත් එයත් එක්කම ඇවිල්ලා කාර් එකට නැග්ගා.

"විපක්ෂෙ කේස්ලු."

ආපහු යනගමන් ඉද්දි අභිලාෂ් කියද්දි ධීර් අභිලාෂ් දිහා බැලුවෙ මෙයා කවද්ද පොලිටිකල් ගැන උනන්දු වුණේ කියලා හිතන ගමන්.

30

"ඔයාගෙ අප්පච්චි කිව්වෙ."

හරියටම ධීර් අහන්න හැදුව ප්‍රශ්නෙ තේරුම් ගත්ත අභිලාෂ් ඊට කලින් උත්තර දුන්නා.

"අප්පටසිරි අප්පච්චි ආවද?"

අභිලාෂ් ඔවු කියන්නඔලුව වැනුවා.

"මැසේජ් එකක්වත් දාන්නම්.නැත්තන් ඉන්න වෙන්නෙ නෑ."

"අම්මා ගෙදර නැද්ද?"

ධීර් නෑ කියන්න ඔලුව වැනුවා.

"ගම්පහ යනවා කිව්වා."

කතාවෙන් කතාව දෙන්නා ආපහු ආවෙ ඔෆිස් එකට.ඒ එද්දිත් ආදිත්‍ය ලැප් එකට එබීගෙන හිටියා.

"හොයාගත්තා.රත්නප්‍රියගෙ නමට තියෙන බයික් එකක් ඒක."

ධීර් ආපු ගමන් අහන ප්‍රශ්නෙ දන්න නිසාම ආදිත්‍ය කලින්ම උත්තර දුන්නා.

"යමු රත්නප්‍රියව මීට් වෙන්න."



"ඊට කලින් සර්ගෙන් අහලා ඉන්න වෙනවා."

අභිලාෂ්ගෙ කතාව හරි කියන්න වගේම ඔවු කියන්න ඔලුව වනපු ධීර් වගේම ආදිත්‍ය කෙලින්ම ගියේ දනුක්ගෙ ඔෆිස් එකට.ගෙදර යන්න ලෑස්ති වෙලා හිටිය දනුක එකපාරටම ගැස්සිලා ගියේ මේ තුන්දෙනා කිසිම අවසරයක් නැතුව ඔෆිස් එකට කඩන් පාත් වෙච්ච නිසා.

"මොනාද ළමයි කරන්නෙ?"

"සොරි සර්...පොටක් පෑදුනා."

දනුක යන්න ගිය ගමන නවත්තලා ආපහු එයාගෙ පුටුවෙන් ඉදගත්තෙ මේ තුන්දෙනාගෙ ස්පීඩ් එක ගැන ආඩම්බර වෙන ගමන්.

"කියන්න"

කියන්න කිව්ව ගමන් ධීර් බැලුවෙ ආදිත්‍ය දිහා.ඉතින් මේ බාර බෝලෙ එයාට පාස් වුණා කියලා තේරුම් ගත්ත ආදිත්‍ය එයාලා හොයාගත්ත දේවල් ගැන කියන්න පටන් ගත්තා.ලොකු දෙයක් නෑ හැබැයි.

"එක බයික් එකක් තියෙනවා සර් ඒ බයික් එක බැන්ක් හය ළගම නවත්තලා තියෙනවා.හේතුවක් නැනෙ සර් එහෙම බැන්ක් හයකට එකම දවසෙ යන්න.ඉතින් ඒ

බයික් එක රත්‍රප්‍රියගෙ නමට තියෙන බයික් එකක්.එයාගෙ ගේ සර්ච් කරන්න තමයි යන්නෙ."

32

"මෙහෙමයි,ගේ ඇතුලෙ හොරකන් කරපුවා දාලා තියෙනවා කියලාම කියන්න බැනෙ නේද?"

ධීර් කරේ ඔවු කියන්න ඔලුව වනපු එක.

"ඒත් බලලා එන්නම්කො සර්."

හා කියන්න ඔලුව වනපු දනුක ලාච්චුවකින් කොළ මිටියක් ඇරන් ඒකෙන් එක කොළයක සයින් එකක් ගහලා ධීර්ගෙ අතට දුන්නා.

"තැන්ක් යූ සර්..."

දනුකට ආචාර කරපු තුන්දෙනා තව දහදෙනෙක්ගෙ ටීම් එකක් එක්ක ගියේ රත්නප්‍රියගෙ ගෙදරට.

"මේක ගෙයක්ද මාලිගාවක්ද?"

ගෙදර ලොකු දැක්ක ගමන්ම ආදිතයට කියවුණේ එයාටත් නැදැනිමයි.

"මිනිස්සුන්ගෙ බදු සල්ලොනෙ."

"මෙතන නැත්තන් කොහෙද ඇත්තෙ?"

අභිලාෂ් බඳු ගැන කියද්දි ධීර් අහගත්තෙ තමන්ගෙන්ම වුණාටආපහු උත්තර දුන්නෙ අභිලාෂ්.



"මේක නිකන්ම නිකන් සැකයක් විතරයි."

ඒක එහෙම නෙවෙයි කියලා හිතන ගමන්ම ධීර් වාහනෙන් බැස්සා.

"මිස්ටර් රත්නප්‍රිය?"

"ඉන්න."

ගේට් එකෙන් ඇතුලට යන්න ධීර්ලාට අවසර නැති නිසා ධීර් බලන් හිටියෙ ඇතුලට ගිය කෙනා එළියට එනකල්.

"තුන්දෙනෙක්ට ඇතුලට එන්න පුලුවන්."

ධීර් කරේ කට කොනෙන් හිනාවෙච්ච එක.

"අපි ආවෙ සර්ච් වොරන්ට් එකක් එක්ක."

ගෙදර ගේට්ටුව ගාඩ් එකට හිටිය මනුස්සයා දැනුයි දැක්කෙ මේ ඇවිල්ලා ඉන්නෙ ආමි එකෙන් කියලා.

"එන්න."

ලැබිච්ච අවසරයත් එක්ක ධීර් වගේම කට්ටියම වට පිට බලන ගමන් ගේ ළගටම ආවා.

"පහක් එළියට පහක් ඇතුලට.."



අණ දීපු ධීර් ගේ ඇතුලට යද්දි ආදිත්‍ය වගේම අභිලාෂ් එයා පස්සෙන් ආවා.

"ඔයාට බෑ ඔහොම මගේ ගේ ඇතුලට කඩා පනින්න."

පෙනුමෙන් ගෙදර අයිතිකාරයා කියලා කියන්න පුලුවන් ටිකක් වයසක මනුස්සයෙක් ධීර්ලාගෙ ඉස්සරහ එද්දි ධීර් කරේ කට කොනෙන් හිනාවෙච්ච එක.

"කඩන් පැන්නෙ නෑ මිස්ටර් රත්නප්‍රිය...ඇවිදන් ආවෙ..."

අනිත් අයට ඇතුල බලන්න කියලා සන් කරන ගමන් ධීර් ගෙදර ගාඩ් එකට හිටිය පෙනුමෙන්ම මැරයො කියලා කියන්නපුලුවන් කට්ටිය දිහා හොදට බැලුවා.ඒ අතරින් හැඩි දැඩි ඇගක් තිබුණ කෙනෙක් ළග ධීර්ගෙ ඇස් නැවතුනා.ඔවු එයාගෙ ඇස් නැවතුනේ ඒ මනුස්සයාගෙ වම් අත ළග.ඒ වම් අත පුරාම විහිදිලා තිබ්බ මකරාගෙ ටැටූ එක ධීර්ට හොදට පුරුදුයි.මොකද එයාට ලැබුණ වීඩියෝස් වල ඒ මකරාගෙ ටැටූ එක තිබුණ මනුස්සයාව ධීර්ට හොදට පුරුදුයි.

"ආදි...."

ධීර්ගෙ අණ තේරුම් ගත්ත ආදිත්‍ය කෙලින්ම ගිහින් ඒ මනුස්සයාට මාංචු දැම්මා.

"ඒ මගේ පර්සනල් බොඩිගාඩ්.තමුන්ලාට බෑ එහෙම එයාව ඇරෙස්ට් කරන්න."

රත්නප්‍රිය මැදින් පනිද්දි ධීර්වත් කවුරුත් එයාව ගමන් ගත්තෙ නෑ.

"ඒක හෙට උසාවියේදි බලාමු."

35

මකරාගෙ ටැටූ එක තිබුණ මනුස්සයාව ඇරෙස්ට් කරලා ධීර් අභිලාෂ් වගේම අදිත්‍ය ආවෙ ඒ මනුස්සයාව දාලා තිබුණ රූම් එකට.පුටුවට ඉදන් හිටිය ඒ මනුස්සයා ළගට ඉස්සල්ලම ගියේ ආදිත්‍ය වගේම අභිලාෂ්.

"එකපාරින් උත්තර දෙනවා නැත්තන් වැඩ වරදියි."

ආදිත්‍ය මුලින්ම ඒ මනුස්සයාට වෝන් කරත් ඒ මනුස්සයා මොකුත් නොකියා බිම බලන් හිටියා.ඒ අතරෙ ධීර් කෝල් එකක් ගත්තෙ පොලිස්පතිතුමාට.

"කියන්න ධීර්."

"අංකල් පොඩ්ඩක් චෙක් පොයින්ට් වල ගාඩ් එක වැඩි කරන්න."

ඒ කෝල් එක ඇහුනෙ නැති අනිත් දෙන්නා එයාලාගෙ වැඩේට බැහැලා හිටියා.

"නම?"

අභිලාෂ්ටයි ආදිත්‍යටයි ප්‍රශ්න අහන්න කියලා ධීර් කරේ පැත්තකට වෙලා බලාගෙන හිටිය එක.

"චන්ද්‍රරත්න."

"තමුන් පිළිගන්නවද තමුන් මේ බැන්ක් රෙබරි එක කරපු අයගෙන් කෙනෙක් කියලා?"



ඒත් ඒ මනුස්සයා මොකුත් කිව්වෙ නැහැ.පුටුවක් තියලා චන්ද්‍රරත්නව වාඩි කරවලා තිබ්බෙ මාංචුත් දාලාමයි.ඊට ඉස්සරහින් ධීර් ඉඳන් හිටියෙ මේ වෙන විගඩම දිහා බලාගෙන.

"කතා කරනවා ඔයි?"

ඒත් ඒ මනුස්සයා කතා නැහැ.

"කියන්න බැරිනම් අපි වෙන විදිහක් බලමුද?"

තාම මනුස්සයා කතා නැහැ.ආදිත්‍යට වගේම අභිලාෂ්ට නම් එපාවෙලා හිටියෙ.

"දැනටමත් ඔයාලා පරක්කු වැඩියි.දැන් ඒ බඩු ටික වරායට යනවාත් ඇති."

ඒ වෙලාවෙ තමයි මේ මනුස්සයා වැඩ වරද්ද ගත්තෙ.මොකද කට වහන් හිටියානම් ධීර් ක්ෂනිකව ක්‍රියාත්මක නොවෙන්න තිබ්බා.ඒත් වුණේ කවුරුත් නොහිතපු දෙයක්.

"අංකල්.පාරෙ එන කන්ටේනර් ගැන බලන්න.ලොරි හරි අවුලක් නැහැ."

කෝල් එකක් ගත්ත ධීර් වෙන්න ඕනි දේ කියලා කෝල් එක කට් කරලා චන්ද්‍රරත්න ළගට ආවා.

"මාලුවා නහින්නෙ කට නිසා කියලා කියනවානෙ."



එයාගෙ මූණටත් තට්ටුවක් දාපු ධීර් එයාගෙ සගයො දෙන්නාත් එක්ක ඒ රූම් එකෙන් එළියට ආවා.

මෙන්න දැන් ලැබුණෙ විශේෂ පුවතක්

අද උදෑසන් සිදුවූ බැංකු මංකොල්ලාකෑම හයට අදාල බඩු භාණ්ඩ සමග මංකොල්ලකෑමට සම්බන්ධ පුද්ගලයන් විසිපස් දෙනෙකු පොලීසිය සහ හමුදා බුද්ධිඅංශය එක්වී කොටු කරගෙන තිබෙයි.මේ සඳහා ප්‍රසිද්ධ ව්‍යාපාරිකයෙකු වූ රත්නප්‍රිය මහතාගේ පුත් රෂ්වාන් රත්නප්‍රිය සම්බන්ධ බව හමුදා බුද්ධිඅංශ පවසයි.මෙම මෙහෙයුම මෙහෙයවූ අය ගැන කිසිදු තොරතුරක් හමුදා බුද්ධිඅංශය මාධ්‍ය වෙත ලබා නොදුන් අතර එම මෙහෙයුමට නායකත්වය දෙන්නට ඇත්තේ හමුදා බුද්ධිඅංය බව පොලිස්පති තුමා පවසා තිබුණි.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු සමගින් ප්‍රධාන ප්‍රවෘත්ති විකාෂය සමගින් හමුවෙමු.

ධීර් ගෙස් කරා මේ බඩු ටික අදම වරායෙන් පන්නයි කියලා.මොකද එයා දැක්කා රත්නප්‍රියගෙ ෆෝන් එකට ඇවිල්ලා තිබ්බ මැසේජ් එකක්.එනිසා ධීර් කරේ කෙලින්ම පොලිස්පතිතුමාට මේ ගැන ඉන්ෆෝන් කරපු එක.මොකද බුද්ධිඅංශයට හැම මගුලක්ම කරන්න බැනෙ.

"ඒකත් ඉවරයි නේද?"

දනුකගෙ ඔෆිස් එකට ආපු ධීර් මූණෙ හිනාවක් එක්ක දනුකට ඉස්සරහා පිටුවෙන් ඉදගත්තත් අනිත් තුන්දෙනාගෙ මූණු දැකලා ධීර්ග මූණත් අවුල් ගියා.

"ඒ පාර මොන මරාලයක්ද?"

38

හිතෙන් හිතන්න ඕනි එක කටින් පිටවෙද්දි දනුක ධීර් අතට දුන්නෙ ලියුමක්.

"මොකද්ද මේ?"

උත්තර නොදුන්න දනුක ධීර්ටම බලන්න කියලා ඇස්වලින් ලියුම් කවරෙ පෙන්නුවා.

"මොකක්?"

ඔවු ඒක මාරුවීමක්.නිකන් නෙවෙයි,දුෂ්කර පලාතකට.සරලවම කිව්වොත් දඬුවම් මාරුවක්.ඒකට හේතුව හිතාගන්න බැරුව ධීර් දනුක දිහා බලද්දි දනුක කරේ උරහිස් අකුලපු එක.

"අහස්ගෙ වැඩක්."

ධීර්ගෙ අත තරහටම මිටිගුලි වෙද්දි අභිලාෂ් ධීර්ගෙ අත උඩින් එයාගෙ අත තිබ්බෙ ධීර්ව සන්සුන් කරන්න.

"කමන් නෑ...මන් යන්නම්....ගිහින් එන්නම් සර්...මන් උදේට ඇවිල්ලා යන්න එන්නම්."

එතන තවත්  ඉන්න හිත නොදුන්න නිසා ධීර් එතනින් එන්න ආවා.ධීර්ව අභිලාෂ්ට පෙන්නුව දනුක නොකියා කිව්වෙ ධීර්ව බලන්න කියලා.ඉතින් මගක් දුර ගියපු ධීර්ව නවත්තගන්න අභිලාෂ්ට පුලුවන් වුණා.

## 39

"තරහින්ද?"

"නෑ මන් හෙන හැපී එකේ ඉන්නෙ.මෝඩ කතා අහන්න එපා අභී.."

අභිලාෂ් අත්දෙක උස්සලා ධීර්ට යටත් වුණා කියලා සන් කරාම ධීර්ට පොඩි හිනාවක් ගියා.

"එයාටම ඔයාව ඕනි වෙන දවසක් එයිනෙ."

ධීර් කරේ ඔවු කියන්න ඔලුව වනපු එක.

"දැන් යනවද?අප්පච්චිට කියලා මොකුත් කරගන්න බැරි වෙන එකක් නැහැ."

ඒක ඇත්ත වුණත් ධීර් ඒකට කැමති වුණේ නැහැ.

"ඕනි නෑ.ගිහින් බ්නලනවා.හැමදේම වෙන්නෙ හොදට කියලා කියනවනෙ."

අභිලාෂ් අවුලෙන් වගේ ඔලුව වැනුවා.

"දැන් ඉතින් මූණ නරක් කරගන්න එපා මැට්ටෝ...උපරිම මාස තුනකින් මන් ආපහු කොළඹට එනවා.ඉන්දියාවෙ යද්දිවත් මෙහෙම හිටියෙ නැනෙ අනේ ඔයා."

අභිලාෂ් කරේ හිනාවෙලා ධීර්ගෙ කරට අත දා ගත්ත එක.

"ඒ වුණාට...දැන්නෙ ඔයා ගිහින් ආවෙ."



"හරි වැඩේ...මං ගිහින් එනකල් පරිස්සමට ඉන්න..."

අභිලාෂ් හා කියන්න ඔලුව වනලා.ධීර් එයාගෙ කාර් එකට නැගලා කෑම්ප් එකෙන් එළියට යන දිහා බලන් හිටියා.ඒ අතරෙ යන ගමන් ධීර් කල්පනා කරේ මේ ගැන අප්පච්චිටයි අම්මාටයි කියන්නෙ කොහොමද කියලා. ධීර් කෙලින්ම ආවෙ ගෙදර.එයා එද්දි ලියාරා වගේම ශෙහානුත් හිටියා.

"මට ටිකක් කතා කරන්න ඕනි.මන් විනාඩි පහෙන් එන්නම්."

එහෙම කියපු ධීර් එයාගෙ කාමරේට ගිහිල්ලා වොෂ් එකක් දාගෙන ආපහු පහළට ආවා.පොඩි ෂෝට්කට ටීෂර්ට් එකක් ඇඳලා හිටිය

ධීර්ගෙ කොණ්ඩෙන් තාමත් වතුර බහිනවා.කොට කොණ්ඩෙන් වතුර බේරෙද්දි ශෙහාන් ධීර්ට රැව්වා.

"මට මුලතිව් වලට ට්‍රාන්සර් එකක් ඇවිල්ලා."

ශෙහාන් බැලුවෙ මේ මොන විකාරයක්ද කියලා බැල්මකින්.

"මං බලාගන්නද?"

ශෙෂාන් වගේම ධීරුයි එයාගෙ අම්මා වෙච්ච ලියාරායි හිටියෙ ධීර්ගෙ ගෙදර සෝෆා එකේ ඉදගෙන තේ බොන ගමන්.ඒ වෙලාවෙ තමයි ධීර් කිව්වෙ එයාට මුලතිව් වලට මාරුවීමක් ඇවිල්ලා තියෙනවා කියලා.බිබී හිටිය තේකත් ශෙහාන්ට පිට උගුරෙ ගියා ඒ වෙලවෙ.

"එපා එපා.මං නැති අඩුව දැනෙන්නත් ඕනි."



අන්න ඒකටනම් ලියාරාට හිනා ගියා.මොකද ධීර් ඒක කිව්වෙ තරහෙන්.ඒක නිකන් තරහක් නෙවෙයි,උපහාසයත් එක්ක මික්ස් වෙච්ච තරහක්.ධීර්ගෙ ඒ කටහඬේ තිබ්බ හඩට තමා ලියාරා හිනාවුණේ.

"විපතක් වෙලා තියෙන වෙලාවෙ හිනාවෙන්න එපා අම්මී."

දැන්නම් ඇත්තටම තරහා ගිහින් හිටිය ධීට් බීලා ඉවරව්කරපු කෝප්පෙ මේසෙ උඩට අතෑරියා.

"කවද්ද යන්නෙ?"

"හෙට උදේ කෑම්ප් එකට යන්න ඕනි."

ශෙහාන්ගෙ නම් කිසිම කැමැත්තක් තිබ්බෙ නෑ ධීර්ව මුලතිවව් යවන්න.ඒත් ධීර් නම් හිටියෙ ටිකක් සතුටෙන්.මොකද එයා දන්නවා අගමැතිගෙ දුව නිසා තමයි ධීර් ඔය පෝස්ට් එකේ ඉන්නෙ කියන කතාව එයාගෙ කෑම්ප් එක පුරාම පැතිරිලා යනවා කියන එක.ඒකට තව හේතුවක් දෙන්න ධීර් කැමති වුණේ නැහැ.

"මොනා කරත් පරිස්සමින්.ඕනි වෙලාවක කෝල් කරන්න..."

ධීර්ට උපදෙස් ටිකකුත් දීලා ශෙහාන් කෙලින්ම ගියේ පාර්ලිමේන්තුවට.ධීර් ඇඳුම් තුන හතරකුත් දාගෙන හෙට පාන්දරම යන්න ලෑස්ති වුණා.

## 42

*මහසෝන් අවතාරය*

ධීර් හිටියෙ මුලතිව් කෑම්ප් එකේ.ලොකු කෑම්ප් එකක් වගේම ඒ ප්‍රදේශයෙ තිබ්බ දේශ්ගුණේ නම් ධීර්ට ඇල්කුවේ නැහැ.බලන බලන තැන දූවිලි වගේම ගොඩනැගිලි විතරක් පේන කෑම්ප් එකේ ගේට් එක ළග ඉදන් ධීර් බැලුවෙ ගේට් එක ළග හිටිය මැදි වයසෙ තරුණයා දිහා.

"මම කර්නල් අධීරා ගෞරද්.මට මෙහෙ ජෙනරල්ව මීට් වෙන්න ඕනි."

ඒ තරුණයා ධීර් දිහා උඩ ඉදන් පහළට බලපු නිසාම ධීරෙයාගෙකාඩ් එකත් පෙන්නලා ඇතුලට ඇවිත් ජෙනරල්ගෙ රූම් එකට ආවා.

"ඉදගන්න."

ජෙනරල්ට සැලුට් කරපු ධීර් ඊට ඉස්සරහා තිබ්බබ පුටුවෙ ඉදගත්තා.

"නම?"

"අධීරා ගෞරද්"

"සර්'නේම්?"

"සූරියබණ්ඩාර"

ජෙනරල් ඔලුව උඩ පහලා කරලා ධීර්ට අතට අත දුන්නා.



"වෙල්කම් ටු අවර් කැම්ප්."

"තැන්ක් යූ සර්"

ජෙනරල්ට ලාවට සැකයක් ආවා මේ ශෙහාන්ගෙ දුවදෝ කියලා.ඒත් එයා ඒක කියන්න ගියේ නැහැ.

"සර් සර්...කැම්ප් එකට එහාපැත්තෙ ගමේ ස්වීසයිඩ් එකක්."

කෝප්‍රල් කෙනෙක් කියලා කියන්න පුලුවන් කෙනෙක් දුවගෙන ඇවිල්ලා කියද්දි ජෙනරල් කරේ ඒ කෝප්‍රල්ට යන්න කියලා අතින් සන් කරපුඑක.

"එතකොට කලින් කැම්ප් එක?"

ධීර් බැලුවෙ ජෙනරල් දිහා.ඒකත් ඇස් දිහා.මොකද ධීර්ට තේරුණා ජෙනරල් ඒ ස්වීසයිඩ් එක ගැන කිසිම තැකීමක් කරේ නෑ කියලා.

"සර් ඒ ස්වීසයිඩ් එක ගැන බලන්න යන්නෙ නැද්ද?"

ජෙනරල් කරේ ධීර් දිහා රවලා බලපු එක.

"තමන්ට අදාල දෙයක් ගැන කතා කරනවා අයිසේ.ඒක ස්වීසයිඩ් එකක්නම් ඒකෙ ආය බලන්න දෙයක් නෑ."

ධීර් කරේ ජෙනරල්ට පේන්නම රවපු එක.

44

"ඒක තමා මගේ ජොබ් එක සර්.මං බුද්ධි අංශ කර්නල් කෙනෙක්."

කලින් කියන්න එපෙයි වගේ ලුක් එකක්  දීපු ජෙනරල් ෆෝන් එක ඇරන් කාට හරි කතා කරා.

"නුවන්..."

"......................."

"ඔවු...වාහනේ ලෑස්ති කරනවා."

ජෙනරල් ධීර් දිහා බලලා රවලා ආපහු නැගිලටලා මෙච්චරවෙලා මේසෙ උඩ තිබුණ යතුරත් ඇරන් ඒ රූම් එකෙන් එළියට ගියා.

"තමුන්ට එන්න බුලත් දෙන්න බෑ."

ගෙනාව බෑග් එකත් එහෙම්මම දාලා ධීර් ජෙනරල් එක්කම ඩිෆෙන්ඩර් එක තිබ්බ තැනට ගියා.

"කවුද ස්වීසයිඩ් කරගෙන තියෙන්නෙ?"

ජෙනරල් ඇහුවෙ ඩ්‍රයිව් කරන ධීර් නුවන් කියලා අඳුරගත්ත කෙනාගෙන්.



"ඒ මනුස්සයා එළිපහලියටවත් එන්නෙ නැති මනුස්සයෙක්ලු.ගමේ අයනම් කියන්නෙ මිනිහාට පිස්සු කියලා.පිස්සු වැඩිවෙලා කියලා තමයි කියන්නෙ.තව අය කියනවා මහසෝන් අවතාරෙ ගහලා කියලා."

නුවන් උත්තර දෙද්දි ජෙනරල් කරේ ෆෝන් එකට අවදානෙ දුන්න එක.මේ මොන වගේ මිනිස්සුද කියලා කල්පනා කරන අතරෙ ධීර් වට පිට බැලුවා.බැලූ බැල්මටම දුෂ්කර ගමක් කියලා පේන ගමක් ළඟින් නුවන් වාහනේ නතර කරා.

"ඩොක්ටර් ඇවිල්ලා ඉන්නෙ සර්."

නුවන් ධීර්ව වගේම ජෙනරල්වත් ඩොක්ට හිටිය තැනට එක්කන් ගියා.

"මොකද වෙලා තියෙන්නෙ?"

"බලලාම ඉන්නකෝ..."

ජෙනරල්ගේ ප්‍රශ්නෙට උත්තර නොදී ඩොක්ට කරේ සුදු රෙද්දකින් වහලා තිබ්බ මිනිය ඇරපු එක.ධීර් එතන දණගහගෙන මිනිය දිහා හොදට බැලුවා.

"මේක වෙලා උපරිම පැය-"

"-පහක් වගේ?"

46

ධීර්ගෙ උත්තරේට ඩොක්ටත් පුදුම වුණා.ඊටපස්සෙ ඩොක්ට කරේ ඔවු කියන්න ඔළුව වනපු එක.දැන් වෙලාව උදේ හතයි.ඒ කියන්නෙ මේක වෙලා තියෙන්නෙ පාන්දර එකත් උදේ හත්ත් අතර.

"ති-"

"-යුනු පිහියකින් බෙල්ල කපාගෙන.ඒකත් දැති තියෙන පිහියකින්. සමහරවිට කියතකින් වෙන්නත් පුලුවන්."

ඩොක්ට ධීර් දිහා බැලුවෙ හිනාවක් එක්ක. මොකද හොදම කෙනෙක්ට තමා එහෙම හැමදේම බලපු ගමන් කියන්න පුලුවන්.

"අපිට කියත්තලේ හම්බ වුණා."

ඩොක්ට පෙන්නුවේ පැත්තක ලේත් එක්කම තිබ්බ කියත් තලයක්.

"ඕකේ බලන්න තියෙන ඒවා බලලා ඉවරද?"

ජෙනරල් ඇහුවෙ ධීර්ගෙන්.ධීර් ඔවු කියන්න ඔළුව වනලා ජෙනරල් එක්කම ආපහු කෑම්ප් එකට ගියා.

ධීර් හිටියෙ ඊළඟ දවසෙ උදේ මෙස් එකටත් ගිහිල්ලා එයාට කියලා වෙන් කරලා දුන්න ඔෆිස් එකේ ඉඳන් ෆයිල් එකක් හදන ගමන්.ඒත් එක්කම ඔෆිස් එක ඇතුලට ආවෙ නුවන්.ඒකත් තව ෆයිල් කන්දකුත් උස්සගෙන.



"තව කෙනෙක් ස්වීසයිඩ් කරගෙන මැඩම්.ගමේ අයනම් කියන්නෙ මහසෝන් අවතාරෙ කියලා."

ධීර් කර කර හිටිය වැඩේ නවත්තලා නුවන් දිහා බැලුවා.

"මොකද්ද දැන් ඔය මහසෝන් අවතාරෙ මිනිස්සු ළඟට ඇවිත් කරන්නෙ?"

නුවන් කරේ ෆයිල් ටික මේසෙ උඩින් තියලා ධීර් දිහා බැලුව එක.

"ගම්මු කියන විදිහට මහසෝන් අවතාරෙගෙ බැල්ම වැටුනම ගම්බිම් පවා පාලුවට යනවා කියලා.ඔය වගේ ගම් තුන හතරක්ම පාලු වුණා මැඩම්."

ධීර් නුවන් දිහා බැලුවෙ මුට මොන පිස්සුවක් හැදිලාද වගේ බැල්මකින්.

"බොරු නෙවෙයි මැඩම්.මීට අවුරුද්දකට කලින්ම මේ කෑම්ප් එක අවට ගම් පහ හයක්ම තිබ්බා.දැන් ඒවා ඔක්කොම පාලු වෙලා.මිනිස්සු ගෙවල් අතෑරලා ගිහිල්ලා."

ඒපාරනම් ධීර් නුවන් දිහා උවමනාවෙන් බැලුවා.මොකද එයාටත් මතකයි අවුරුද්දකට කලින් වගේ අභිලාෂ්ලා ආදිත්‍යලා එක්ක ධීර් මීඩියාස් වලට බැන්නා මෙහෙම විකාර දානවා කියලා.ඒත් ඒ ගැන ධීර්ට ගානක් ගියේ නැහැ.

"දැන් ඒ ඉඩම් වලට මොකද වෙලා තියෙන්නෙ?"

"කිකම්ම පාලුවට ගිහින් තියෙන්නෙ මැඩම්."



"තව කවුද මැරිලා තියෙන්නෙ?"

"නමක් ගමක් දන්නෙනම් නෑ හැබැයි මනුස්සයෙක්."

නුවන් එතනින් යන්න ගියේ  ඊළගට හිද ඒවා අහගන්න්ස් වෙනවා කියලා එයාගෙ හිත කිව්ව හිනා.අතේ තිබ්බ පෑනෙන් නුවන්ට ගහපු ධීර් වෙන පෑනකින් ෆයිල් ටික ක්ම්ප්ලීට් කරන්න ගත්තා.ඉදලා ඉදලා බැරිමතැන ධීර් ආදිත්‍යට කෝල් එක්ක් ගත්තෙ අභිලාෂ්ගෙ ෆෝන් එක වැඩ නැති නිසා.කෝල් කීයක් කියලා ගත්තද?

"හෙලෝ...."

"අප්පේ...චීෆ්ට අපිවත් මතක් වෙලා නේ."

"උදව්වක් ඉල්ලන්න බං ගත්තෙ."

"ඒකතමා,මං ඒත් බැලුවා චීෆ්ට ඇයි අපිව මතක් වෙලා කියලා."

"විහිලු නෙවෙයි ඕයි.අභීට ෆෝන් එක දෙන්න...එයාගෙ එක වැඩ නෑ."

"එයයිගෙ ෆෝන් එක ලොක්කා බිම ගැහුවානෙ.දැන් ඒක වැඩ නෑ."



"දෙනවකො ඉතින්."

"කියන්න."

"මට උදව්වක් ඕනි."

"මොකද්ද ඒපාර කරන්න හදන්නෙ?"

"ඒක වැඩක් නෑනෙ.මට මුලතිව් කෑම්ප් එක අවට තියෙන ඉඩම් ටික ගැන තොරතුරු ඕනි.ඉඔක්ම කරන්න."

"හා හා."

අභිලාෂ්ටත් වෙන්න ඕනි දේ කියලා ධීර් ඇඳේ ඇලවුණේ හොඳට නිදාගන්න කියලා හිතාගෙන.ඒත් හවස මැරිලා හිටිය ළමයාගෙ මූණ දකිද්දි ධීර්ට නින්ද අහලකටවත් ආවෙ නැහැ.ඔවු එයා අද හවසත් ගියා දෙවෙනි ස්වීසයිඩ් එක ගැන බලන්න.ඒත් ධීර් දන්නවාඒක මර්ඩර් එකක් කියලා.මොකද කියත් තලෙන් බෙල්ල කපාගන්නවා කියලා

කියන්නෙ කරන්න අමාරු දෙයක්.ඉතින් ඒක කරගන්නවට වඩා ලේසි ක්‍රම තියෙනවා ජීවිතේ නැති කරගන්න.ඉතින් ඒ ගැන හිත හිත හිත ඉද්දිම ධීර්ට නින්ද ගියා.

උදේ නැගිට්ට ධීර් වොෂ් එකක් දාලා එයාගෙ ඔෆිස් එකට යද්දි නුවන් ධීර්ගෙ ඔෆිස් එක අස් කරනවා.

"නුවන් මෙහෙ කියත් හදන තැන් තියෙනවද?"



නුවන් කර කර හිටිය වැඩේ නවත්තලා ටිකක් කල්පනා කරලා බැලුවා.

"ගම කෙරවලට වෙන්න එකක් තියෙනවා.ඒකෙ හදන්නෙ කියත් විතරයි.ඇයි මැඩම්?"

ධීර් ඔලුව වනලා එයාගෙ පුටුවෙන් ඉදගත්තා.

"හවසටඒ පැත්තෙ ගිහින් එමු."

නුවන් ප්‍රශ්න අහන්නෙ නැතුව හා කියන්න ඔලුව වනලා එතනින් ගියා.ධීර් එයාගෙ වැඩටිකත් ඉවර කරලා හවස් වෙලා කලඞ් එකක් ඇදලා නුවන් එක්ක පයින්ම ගම කෙරවලට ආවා.

"මොනවද නෝනා බැලුවෙ?"

ධීර් කියත් තල දිහා හොදටබැලුවා.ඒ වගේම මිණීමැරුම වෙලා තිබ්බ කියත් තලෙත් ධීර්ට හොදට මතකයි.ඒ වගේමයි කියතෙ තිබ්බ පොඩිම පොඩි ලෝගෝ එක.ඒ වගේම ලෝගෝඑකක් තමයි මේ තල වලත් තිබ්බෙ.

"මුදලාලි හුගක් කල් ඉඳලා මේ බිස්නස් එක කරනවාද?"

ධීර් ඇහුවෙ කියත් තලයක් අතට ගන්න ගමන්.

"ඒමයි නෝනා.අවුරුදු ගානක් මම මේකම තමා කරනවා."

ඒ මනුස්සයා දෙමල වුණත් එයා අමාරුවෙන් සිංහල කතා කරා.

51

"මේ කියත් තලේ කීයද?"

තමන් අතට ගත්ත කියත්තලේ මුදලාලිට පෙන්නන ගමන් ධීර් අහද්දි මුදලාලි ධීර් දිහා බැලුවෙ හිනාවෙලා.

"ඕක එකසිය පනහක් තමා වෙනවා නෝනා."

"දෙන්න."

එකසිය පනහකුත් දීලා කියත් තලෙත් ගත්ත ධීර් ආපහු නුවන් එක්කම කෑම්ප් එකට එන්න පිටත් වුණා.

"පිස්සුද මැඩම්?"

පත්තර කොලේක ඔතලා දුන්න කියත් තලේ එළියට අරගත්ත ධීර් ඒකෙන් කොච්චර ගැඹුරට කැපෙනවද බලන්න තමන්ගෙම අල්ල උඩ ලාවට වගේඇදන් ගියා ගියාමයි නහරයක් කැපුණා වගේලේ එන්න ගත්තෙ නුවන්ට කෑ ගැස්සෙද්දි.

"කැගහන්න එපා බං.සතුටු වෙයන් මං බෙල්ල කපාගෙන බල්ලපු නැති එක ගැන."

මෙච්චර වෙලා සාක්කුවේ දාගෙන හිටිය බැන්ඩේජ් එක අරන් තමන්ගෙ අත බැන්ඩේජ් කරගත්ත යීර් කියත් තලේ නුවන්ගෙම අතට දුන්නා.ඊට පස්සෙ දෙන්නා කෙලින්ම ගියේ ජෙනරල්ගෙ ඔෆිස් එකට.ඒ යද්දිත් ජෙනරල් ලොකු වැඩිෆක් කරන ගමන්.



"සර් මේක ස්වීසයිඩ් එකක් නෙවෙයි."

"එහෙනම්?"

"සර් මේක ප්ලෑන් කරපු මර්ඩර් එකක්.මනුස්සයෙක් කියත් තලේකින් තමන්ගෙම බෙල්ල කපාගනියිද?අනිත් එක එකම විදිහට ස්වීසයිඩ් හයක් වෙන්න බෑනෙ සර්."

ජෙනරල් කරේ යීර් දිහා බලන් හිටිය එක.යීර් තාම හිටගෙන.

"දැන් මොකද්ද කරන්න කියන්නෙ?"

"මං මේ කේස් එක බාරගන්නම්.මට දවස් තුනක් දෙන්න මන් මේ කේස් එකේ මුල මැද අග හොයාගන්නම්."

ජෙනරල් මොකුත් නොකියා හා කියන්න ඔළුව වැනුවා.

"තැන්ක් යූ සර්."

ජෙනරල්ටත් සැලුට්කරලා ධීර් කෙලින්ම ආවෙ එයාගෙ ඔෆිස් එකට.අභිලාෂ් ගෙන් ආව කෝල් එක ධීර් ආන්ස්වර් කරේ හොඳ ආරංචියක් අහන්න හිතාගෙන.

"ජයවීර ඇමතිට."

"ඔක්කොම?"



"නෑ...එක ගමක් ඉතුරු වෙලා තියෙනවා.ඒ නිසා එයාට තාම ඒ මුලු ඉඩමටම අත තියන්න බැහැ."

"ඒ කියන්න එයත් මේකට සම්බන්දයි."

"මොකටද?"

"මන් පස්සෙ කියන්නම්කො.මට තියෙනවා මහසෝන් අවතාරෙ අල්ලගන්න."

කෝල් එක කට් කරපු ධීර් නුවන්ට කතා කරේ මේ වෙලාවෙ ධීර්ට උදව් කරන්න පුලුවන් හොදම කෙනා එයා හිතුවා.

"කියන්න මැඩම්."

නුවන් ආව ගමන් ධීර්ගෙ ඉස්සරහින් ඉදගත්තා.

"ඔය මහසෝන් අවතාරෙ එන්නෙ කීයට වගේ කියලාද මිනිස්සු කියන්නෙ?"

නුවන් ධීර් දිහා බැලුවෙ එයත් මේ අවතාර කතාව විශ්වාස කරන්න පටන් ඇරන්ද කියලා කල්පනා කරන ගමන්.

"ඇ කියලා තමා කියන්නෙ?"



"මෙහෙමයි,ඔය මහසෝන් අවතාරෙ එන්නෙ කොයි වෙලාවටද කියලා බැලුවොත් රැටනෙ.අපේ අයගෙන් ටීම් එකක් දාලා තියන්න ගමවටේටම.අපි බලමු මහසෝන් අවතාරෙ කොයි වගේද කියලා."

නුවන් ධීර් දිහා බලන් හිටියෙ මේ මොන විකාරයක්ද වගේ බැල්මකින්.මොකද ධීර් මේ හදන්නෙ අවතාරයක් අල්ලන්නනෙ.

"කලබල වෙන්න එපා මනුස්සයෝ...වැඩේ උනාට පස්සෙ ඊළග ස්ටෙප් එක ගැන අපි කතා කරමු."

නුවන් කරේ ඔලුව වනලා ඔෆිස් එකෙන් එළියට ගිය එක.

"මේක හරියයි ද මැඩම්?"

කට්ටියම මේ තැන් තැන් වල ගෙවල් ළගට වෙලා ඉන්නෙ මහසෝන් අවතාරෙ අල්ලගන්න.ධීර්ට ගම තාමපුරුදු නැති නිසා නුවන් ධීර් එක්ක ගෙයක් ඉස්සරහ බලන් හිටියා.

"මැඩම්?"

ඔවු නුවන්ට වගේම ධීර්ට ඉස්සර්හින් තිබ්බ ගෙදර දොර හොරෙන් ඇරිය සම්පූර්නයෙන්ම කළු ඇදගත්ත කෙනෙක් ගෙදර ඇතුලට ගියා.



"ඉවසන් ඉන්නවා."

තමන්ගෙ ඕඩර් එක දීපු ධීර් බලන් හිටියෙ මහසෝන් අවතාටෙ කියලා ගම්මු හදුන්වපු අවතාටෙ එළියට එනකල්.

"තමුසෙ ගේ ඇතුලට යනවා.මන් අරූ පස්සෙන් යන්නම්."

නුවන් ගේ ඇතුලට යද්දි ධීර් අවතාරෙ පස්සෙන් යන්න ගත්තා.ධීර් වගේම දක්ෂ මනුස්සයෙක් වෙච්ච අවතාරෙ ධීර් පැත්තට හැරෙද්දි ධීර් ඉණේ ගහන් හිටිය කිනිස්ස ඇදලා ගත්තා.අවතාටෙ ඉස්සල්ලම ඇටැක් කරද්දි අමාරුවෙන් වුණත් ල්පාරවල් නවත්තගත්ත ධීර් ආපස්සට ඇටැක් කරේ කිනිස්සෙන් අවතාරෙගෙ උරහිසේ හම ඇත් කන ගමන්.ධීර්ට පිටිපස්සෙන් ආමි එකේ අය එන්න ගත්ත ගමන්ම අවතාරෙ දිව්වා.

"ශිට්......"

ධීර් තරහෙන් කිනිස්ස බිම දාද්දි ආමි එකේ අය අවතාරෙ පස්සෙන් ගියා.කොහොමහරි හැමදේම හරි යන්න කියලා ආමි එකේ අයට අවතාරෙ අල්ලගන්න පුලුවන් වුණා.

"කියපන් අයිසෙ?"

අවතාරෙ අල්ලගත්තා කියලා හිතනවා නම් වැරදිලා.මොකද මේ හමුදාපති මුලතිව් වලටම ඇවිල්ලා ධීර්ට කෑගහනවා.නිකන් නෙවෙයි,ඇදන් හිටිය ෂර්ට් එකෙන් අල්ලගෙන හොලවන ගමන්.



"තමුසෙගෙ කරදරෙන් බේරෙන්න මෙහෙට එව්වම මෙහෙත් පටන් ගත්තද රගන්න?"

"රගන කෙනා කොහෙ වුණත් රගනවානෙ සර්-"

-චටස්....

"තමුසෙ නහින්නෙ ඔය කට හින්දාම තමයි."

අත දිගෑරලා ධීර්ව විසි වෙන්න ගහපු හමුදාපති මුලතිව් කෑම්ප් එකේ ජෙනරල්ගෙ පුටුවෙන් වාඩි වුණා.ඔන්න ඔයවෙලාවෙ තමයි නුවන් ඔෆිස් එකට කඩන් වැදුනෙ.

"සර් ජනාධිපතිතුමායි අගමැතිතුමයි එනවා."

නුවන් පණිවිඩේ දීලා ඉවර වෙන්න කලින් ශෙහාන් දනුක වගේම ජනාධිපති වෙච්ච විරේන් ජයභාහුත් ඔෆිස් එකට කඩන් වැටුණා.

"මොකද්ද අහස් මෙතන වෙන්නෙ?"

ඔෆිස් එකට ආව විරේන්ට ඉස්සල්ලම ඔලුවට ආව ප්‍රශ්නෙ තමයි ඒක.මොකද ධීර් හිටියෙ තොලත් පලාගෙන.

"මොකුත් නැහැ සර්.මේකි පුදුම වදයක් සර් මට දුන්නෙ කොළඹ ඉද්දි.නැති ප්‍රශ්නත් ඇති කරනවා.මෙහෙට එව්වම දැන් මෙහෙ ප්‍රශ්න ඇති කරනවා."



විරේන් වගේම ශෙහානුත් ධීර් දිහා බැලුවෙ මේ මොනාද කියන්නෙ කියලා දැනගන්න.

"මෙහෙමනෙ සර්,කකුලුවා නටන්නෙ හැලිය රත් වෙනකල් විතරයි කියනවානෙ."

අහස් වෙච්ච මේජර් ජෙනරල් ආපහු ධීර්ට ගහන්න අත ඉස්සුවත් ඊට වඩා ඉස්සර වෙච්ච ශෙහාන් අහස්ව නැවැත්තුවා.

"මෙහෙමනෙ සර්,අහස් ගම්ලත් කියන මේ මනුස්සයා සෞඛ්‍ය ඇමතිගෙ එහෙමත් නැත්තන් ජයවීරගෙ උවමනාවට මාව මාරු කරා.ඒත් මාව මෙයා මාරු කරේ වැරදි තැනට.ඒකත් පැත්තක දැම්මොත් කියත් කඩකාරයාගෙ පුතාවත් අල්ලගෙන අවුරුදු දෙකක ඉදන් මහසෝන් අවතාරය කියලා එකක් හැදුවා.මිනිස්සුන්ව ගම්වලින් අයින් කෙරෙව්වා.ඒත් අහස් ගම්ලත් දන්නෙ නැහැ ඒකට හේතුව මොකද්ද කියලා.මතකද නිවුස් එකක් ගියා මුලතිව් වල මිනිරන් පතලක් තියෙනවා කියලා.ඇමතියා ඒකට තමයි ඔක්කොම එකතුවෙලා විදින්න හැදුවේ."

ධීර් අහස්ට රවද්දි විරේන් හිටියෙ තරහෙන්.තරහා යන්නෙ නැද්ද ඉතින් රටේ හමුදාපති කොහොම කෙනෙක්ද කියලා හරියටම දැනගත්තාම.

"තමුන්ගෙ ප්ලෑන් ඔක්කොම අපි දන්නවා අයිසෙ.ලැජ්ජ නැද්ද සල්ලි වලට අවතතාර හදන්න..........ඔන්න ඉතුරු ටික දනුකට බාරයි."

විරේන් අහස්ට නෝන්ඩි හිනාවක් දාලා කිව්වෙ අහස්ව දනුක පැත්තට තල්ලු කරන ගමන්.දනුක අහස්ව ඇරන් යද්දි ඔෆිස් එකට ආවෙ අභිලාෂ් වගේම ආදිත්‍ය.

"ඔයාට කරදරයක් නැනෙ?"



අභිලාෂ් ආපු ගමන් ධීර්ව හග් කරාම ශෙහාන් ඒ දිහා බලන් හිටියෙ හිතේ සතුටක් එක්ක.

"කොහොමද චීෆ් හරියටම මේකෙ මුල ඉන්නෙ අර ඇමතියා කියලා කිව්වෙ?"

"එක දවසක් මට ඇහුනා අහස් ඇමතිතුමා එක්ක කතා කරනවා.අපි අනික අවතාරෙත් අල්ලගත්තා.ඒ මිනිහාට දෙකක් අනිද්දි ඔක්කොම කිව්වා.මේ ඉඩම යට මිනිරන් පතලක් තියෙනවා.ඒකට තමා ඇමතියා විදින්න ලැස්ති වුණේ.ඒකට අර කියත් කඩකාරයාගෙ පුතාවත් අල්ලගත්තා.ඊට පස්සෙ ඇමතියා අහස්වත් අල්ල ගත්තා. බොරුවට මිනිස්සු ගොඩකගෙ ජීවිත නැති කරා.ඕක තමා කතාව."

තමන් ඉස්සල්ලා කරපු විස්තරේ අහන්න මේ දෙන්නා නොහිටිය නිසා ආපහු ධීර් කෙටියෙන් කතාව කිව්වා.මුලතිව් වලට ඇවිල්ලාත් අවුලක් නෑ කියලා හිතන ගමන් ධීර් කරේ අභිලාෂ්ට තුරුල් වෙච්ච එක.

"මදෑ දැන් ඔය වෙලිලා හිටියා.දැන් යමු කොළඹට."

ශෙහාන්ගෙ කතාවට ධීර් කරේ බෑ කියන්න ඔලුව වනපු එක..

"දැම්ම බෑ ටික දවසකින් එන්නම්."

ධීර්ට කොළඹ යන්න ලොකු හදිස්සියක් තිබුණෙ නැහැ වගේම ධීර්ට ඕනි වුණා කොළඹ තියෙන නාගරික පරිසරයෙන් ටිකක් ඈත් වෙන්න.මොකද ධීර්ට මේ දවස් ටිකේ මාර නිදහසක් දැනුනා.



ඒ නිසාමයි ධීර් තව ටික කාලයක් ශෙහාන්ගෙන් වගේම විරේන්ගෙන් ඉල්ලුවේ.

"ඕකේ...මගේ වැඩ දැන් ඉඹවරයි.මන් හෙට ඉන්දියාවේ යන්නත් ඕනි.මන් යන්නම්."

විරේන් යන්න යද්දි ශෙහාන් ඇරෙන්න අනිත් කට්ටියම විරේන්ට සැලුට් කරා.

"අපිත් යන්නම්...පරිස්සමින්,"

"ඔයත්..."

අභිලාෂ් වගේම අනිත් අයත් ධීර්ට සමු දීලා කොළඹ එන්න පිටත් වුණා.

## 60

*අගමැති ඝාතනයට තැත් කිරීම*

දනුක හේරත් යුධ හමුදාපති නිලයට උසස් වෙද්දි මුලතිව් වල හිටිය ජෙනරල් දියතලාවට මාරු කෙරුණා.මුලතිව්වලට අලුතෙන් ආවෙ ජෙනරල් සේනාරත්න.ඉතින් දැන් මේ ධීර් වගේම නුවන් සේනාරත්නගෙ ඔෆිස් එක ඉස්සරහා හිටන් ඉන්නෙ සේනාරත්නව මීට්වෙන්න.

"කම් ඉන්..."

අවසර ලැබුණ ගමන්ම ධීර් වගේම නුවන් ඇතුලට ආවා.ඇවිල්ලා ආචාර කරලා සෙනාරත්න ගෙ සන් කිරීමත් එක්ක පුටු දෙකෙන් ඉදගත්තා.

"කැප්ටන් නුවන් පෙරේරා?"

නුවන් ඔවු කියන්න ඔලුව වැනුවා.

"බුද්ධි අංශ කර්නල් අධීරා ගෞරද්?"

ධීරුත් ඔවු කියන්න ඔලුව වැනුවා.

"අධීරා ගැනනම් මන් කලම්බො වල ඉද්දි අහලා තියෙනවා.ඒ කාලෙ අධීරා කැප්ටන්...මතකද දන්නෙ නැහැ.මන් එතකොට ලුතිනන් කර්නල්."

සේනාරත්න මේ මතක් කරන්නෙ මීට අවුරුදු හතරකට කලින් අතීතයක් ගැන.එච්චර කාලෙකට කලින් හිටිය අයගෙ නම් මතක තියාගන්නනම් ධීර්ට කිසිම උවමනාවක් තිබ්බෙ නෑ.

61

"සොරි සර්..."

අවංකවම ධීර් සේනාරත්නගෙන් සමාව ඉල්ලුවා.මොකද ඇත්තටම එයාට ඒ ගැන මතකයක් නැහැ.

"ඉට්ස් ඕකේ...නුවන් මට කැම්ප් එක පෙන්නන්න.තැන්ක් යූ අධීරා..."

සේනාරත්නටත් සැලුට් කරලා ධීර් කෙලින්ම ආවෙව් එයාගෙව් ඔෆිස් එකට.ඇවිල්ලා කෝල් එකක් අත්තෙ අභිලාෂ්ට.

"හෙලෝ?"

"අලුත් ජෙනරල් කොහොමද?"

"අවුලක් නෑ වගේ.ඔයාලා කෑම්ප් එකට එන්න කලින් හිටිය ලුතිනන් කර්නල් කෙනෙක්."

"එහෙනම් අවුලක් නෑනේ."

"ශේප්..."

"දනුක සර් වෙනුවට ඇවිල්ලා ඉන්න කෙනානම් ලේසි වෙන එකක් නැහැ."

"ඒ මොකෝ?"



"ඔයා වගේම තමයි.බැලුවොත් මල පැනලා."

"අහී...."

"හරි හරි.ඒක නෙවෙයි මොකද කරන්නෙ?"

"ඔෆිස් එකට ආවා."

"කාලද?"

"තාම නෑ..."

"යීර්.....අහන්නකො...."

"කියන්නකෝ....?"

"ඇවිල්ලා ඉන්න ජෙනරල්-"

"ඉතින්?"

"පට්ට කුලුල් කේන්ති කාරයෙක්."

"හොද වැඩේ."

"හොද වැඩේ කියන්න එපා.ඔයා ආපහු මෙහෙට ආවම වැඩ කරන්න තියෙන්නෙ මෙයා එක්ක තමා.

63

"ආ ඒකට තව කල් තියෙනවානෙ?"

"එහෙමද?"

"ඔවු...මේ...මන් ඊයෙ රෑ අප්පච්චිව මීට් වෙන්න ආවා."

"කිව්වෙවත් නැනෙ."

"හදිස්සියෙ අනේ ආවෙ.පාන්දර තමා මුලතිව් ආවෙ.කොහොමහරි මට කම්පැනීස් දෙකම බාරගන්නලු."

"රණ්ඩු වුණානේ?"

"ටිකක් කෑ ගැහුවා."

"අවුලක් වුණේ නැනෙ?"

"න්පුව ඇති නේද?"

"ධීර්-කියන්න-හරි මන් එන්නම් කියන්න-"

"හෙලෝ?අභී?"

"ලොක්කා හොයනවලු මන් යන්නම්..."



"හරි පරිස්සමින්."

අභිලාෂ් කියන්න ගිය එක කියාගන්න බැරිවුණ නිසා වගේම කෝල් එක හදිස්සියේ කට් කරඖ නිඹසා ධීර්ට ටිකක් අවුල් ගියා.සාධාරණයි ඉතින්.

මේ අතරෙ අභිලාෂ් කෙලින්ම එයාගෙ ඔෆිස් එකෙන් එළියට ආවා.

"සර්?"

අභිලාෂ් පුලුවන් ඉක්මනට ජෙනරල් හොයාගෙන ආවෙ එයාගෙ තරහා ගැන මේ දවස් දෙක තුනට තේරුම් ගත්ත නිසා.

"එන්න කිව්වම එන්න දැනගන්නවා අයිසේ.ෆෝන් එකේ කාත් එක්කද එල්ලිලා හිටියෙ?".

දැන් දෙන්න උත්තරයක් හිතාගන්න බැරුව අභිලාෂ් බිම බලාගත්තා.මොකෝ ධීර් එක්ක කතා කරා කියලා කියන්න ඇයි.කියන්න සාධාරණ හේතුවන් නැහැ නෙ.ඉතින් අභිලාෂ් බිම බලාගත්තා.

"කෙල්ල එක්ක වෙන්න ඇති.ඕවා මාත් එක්ක තියාගන්න එපා.මන් හදන්න දුන්න ෆයිල් එක තව පැයක් යද්දි මගේ මේසෙ උඩ තියෙන්න ඕනි."

"ඕකේ සර්"

මෙහෙමත් මිනිහෙක් කියලා හිතෙන් හිතුව අභිලාෂ් එයාගෙ ලික්කාට සැලියුට් කරලා ඔෆිස් එකෙන් එළියට ආවා.



එහෙම්මම අභිලාෂ් ආවෙ එයාගෙ ඔෆිස් එකට.ඇවිල්ලා පැයක් යන්නත් කලින්ම ෆයිල් එව්ක හදලා ජෙනරල්ගේ ඔෆිස් එකට ගෙනාවා.

"ගුඩ්..."

ජෙනරල් ෆයිල් එක බලන අතරතුරේදි අභිලාෂ් කල්පනා කරේ නිවාඩුවක් ඉල්ලනවද කියලා.

"සර් මට නිවාඩුවක් ගන්න පුලුවන්ද?"

"ඔවු."

"තැන්ක් යූ සර්..."

කලඩ් එකකින් හිටිය ධීර් හිටියෙ එයාගෙ ඔෆිස් එකේ.

"මැඩම්ව මීට් වෙන්න කැප්ටන් කෙනෙක් ඇවිල්ලා."

මේ වෙලාවෙ තමන්ව මීට් වෙන්න එන්නෙ කවුද කියලා හිතන ගමන් ධීර් එයාට එන්න කියන්න කිව්වා.

"එන්න කියන්න."

ටික වෙලාවක් යද්දි ධීර්ගෙ ඔෆිස් එකට ආවෙ අභිලාෂ්.



"අභී?"

අභිලාෂ් හිටියෙ එයාගෙ පුරුදු හිනාවත් එක්ක.

"ඔයා  මෙහෙ?"

"බලන්න හිතුනා.ඉතින් ආවා."

අභිලාෂ් ධීර්ට ඉස්සරහින් තිබ්බ පුටුවෙන් වාඩි වුණා.ධීර් නම් හිටියෙ මේ මොකද්ද වුණේ කියලා හිතා ගන්න බැරුව.

"මොකක් හරි අවුලක් තියෙනවා නෙ?"

අභිලාෂ් කරේ නෑ කියන්න ඔලුව වනපු එක.මේ දෙන්නා අතර මාර තේරුම් ගැනීමක් තියෙනවා කියන්න තවත් සාක්ෂි මොකටද?

"නැත්තෙ නෑ.මූණෙන් පේනවා.අහී?

අභිලාෂ් ලොකු හුස්මක් පාත දැම්මා.

"මට මගේ අම්මයි තාත්තයි ගැන හොයාගන්න ඕනි."

ධීර් අභිලාෂ් දිහා බැලුවෙ අසරණ වෙලා වගේ.මොකද දනුක අභිලාෂ්ගෙ අම්මයි තාත්තයි ගැන කලින් හොයලා තිබ්බා.ඒත් අම්මා බ්ලාස්ට් එකකට අහුවෙලා



නැතිවෙලා.ඉතින් දැන් මෙයා ඔය ගැන හොයන්න ගියත් කිසිම දෙයක් හොයාගන්න වෙන්නෙ නැහැ කියනඑක ධීර්ගෙ හිත ඇතුලෙ දෝන්කාර දුන්නා.ඒත් ධීර් දැනන් හිටියෙ නෑ එයා හිතුවඑක වැරදියි කියලා.ධීර්ට අමතක වුණා අභිලාෂ්ට තාත්තා කෙනෙකුත් ඉන්න ඕනි කියන එක.

"කොහෙන්ද අපි පටන් ගන්නෙ?"

අභිලාෂ් කරේ දන්නෙ නෑ කියන්න උරහිස් අකුලපු එක.ධීර් ඒ ප්‍රශ්නෙ ඇහුවෙ අහන්න වෙන දෙයක් නොතිබුණ නිසා.

"ඕකේ-"

අභිලාෂ්ට ආව කෝල් එක නිසා අභිලාෂ් ලොකු හුස්මක් පාත දාලා කෝල් එක ආන්ස්වර් කරා.

"හෙලෝ?"

"නිවාඩුව කැන්සල්.ඉන්න තැනකින් එනවා.අගමැතිතුමාට වෙඩි තියලා."

"මොකක්? කවුද සර් කරලා තියෙන්නෙ?"

"කරපු එකා හොයාගන්න පුලුවන්නම් තමුන්ට එන්න කියන්නෙ නෑනෙ."

"සොරි සර්"

"ඒ වු ඉසෙඩ් කියන්න බෑ අයිසෙ.එනවා කෑම්ප් එකට."

68

"ඕකේ සර් මන් එන්නම්."

අභිලාෂ් බැලුවෙ ධීර් දිහා.මේ වෙද්දිත් ධීර් හිටියෙ ඒ ඇහුච්ච දේ ප්‍රොසෙස් කරගන්න බැරුව.

"මොකද්ද ඒ කතාවෙ තේරුම?"

අභිලාෂ් කරේ ධීර්ගෙ අතින් අල්ල ගත්ත එක.

"කලබල වෙන්න එපා.අපි ගිහින් බලමු."

හා කියන්න ඔලුව හොල්ලපු ධීර් නුවන්ටත් කියලා ඉක්මනට කොළඹ ආවා.අද බ්‍රේකින් නිවුස් එක වුණේ අග්‍රාමාත්‍ය ශෙහාන් සූරියබණ්ඩාරට වෙඩි වදී කියන එක.ඉතින් ධීර් හිටියෙ මේ මොකද්ද වුණේ කියලා හිතාගන්න බැරුව.ඊට වඩා ධීර් සම්පූර්නයෙන්ම කඩා වැටිලයි හිටියෙ.

"කලබල වෙන්න එපා.අපිබලමු මොකද්ද වුණේ කියලා."

මේ දෙන්නම ගියේ එයාලාගෙ පුරුදු ඔෆිස් එකට.ඒ යද්දිත් ආමි එකේ හය දෙනෙක් ධීර්ව අල්ලගත්තෙ අභිලාෂ්වත් පුදුම කරලා.

"ශෙහාන් සූරියබණ්ඩාරට වෙඩි තිබ්බ එක ගැන සැකපිට තමුන්ව ඇරෙස්ට් කරනවා."

"මේ මොන විකාරයක්ද?අභී මොකද්ද මේ වෙන්නෙ?"



අභිලාෂ්ට උත්තරදෙන්න නොදී ධීර්ව ආමි එකේ අය ඇදගෙන යද්දි අභිලාෂ් කෙලින්ම දිව්වෙ දනුකව හොයාගෙන.මේ අතරෙ ධීර් හිටියෙ ප්‍රශ්නකිරීම් වලට වෙන් වෙලා තිබ්බ රූම් එකේ.මේ කෑම්ප් එකට අලුතෙන් ආව ජෙනරල් තේනුවර හිටියෙ ධීර්ට ඉස්සරහින්.

"මන් මොකටද සර් මගේ අප්පච්චිටම වෙඩි තියන්නෙ?"

ධීර් අහපු ප්‍රශ්නෙට තේනුවර කරේ හිනාවෙච්ච එක.

"තමුන් ඊයෙ ඇයි කොළඹ ආවෙ?"

ධීර් තේනුවර දිහා බැලුවෙ පුදුමෙන්.මොකද එයා ඇත්තටම ඊයෙ කොළඹ ආවෙ එයාගෙ අප්පච්චිව මීට් වෙන්න.

"අප්පච්චිව මීට් වෙන්න."

"එතකොට ඊයෙ හවස තමුන් ශෙහාන් සූරියබණ්ඩාර එක්ක බහින් බස් වීමක් වුණා?"

"ඔවු."

"ඒකම ඇති තමුන්ව ඇරෙස්ට් කරලා අවුරුදු ගානක් තියන්න."

"මිස්ටර් හිතන්න එපා මන් මේ පෝස්ට් එකට අත උස්සලා ආවා කියලා.මට විරුද්ධව තියෙන සාක්ෂි ඉදිරිපත් කරන්න."

"තව ටික දවසක් දෙන්න.මන් හැමදේම හොයාගන්නම්."

70

ධීර්ට රවලා තේනුවර එතනින් යන්න ගියා.ඒත් එක්කම ධීර්ගෙ මතකෙ ඇදිලා ගියේ ඊයෙ රෑ වෙච්ච සිද්දියට.

ධීර් වගේම ශෙහාන් හිටියෙ ශෙහාන්ගෙ ඔෆිස් එකේ.

"මන් ඔයාට නිදහස දුන්නා වැඩියි ධීර්."

ඒත් ධීර් නිෂ්ශබ්දයි.

"මං ඔයාට කියන්නෙ මේ අම්මිගෙයි මගෙයි බිස්නස් බාර ගන්න කියලා විතරයි.ඇයි ඒක කරන්න බැරි?"

ඒත් ධීර් නිශ්ශබ්දයි.

"මන් අභිලාෂ් පුතත් එක්කත් කතා කරන්නම්.ඔයාට බැරිනම් එයා හරි මේවා බාර ගනියිනෙ?"

"ඇයි අප්පච්චිහි මට බල කරන්නෙ?තාම ඔයා හොදට ඉන්නවනෙ.තාම මැරිලා නැනෙ.මට බල කරන්න එපා."

"ඔවු මැරුණම තේරෙයි."

"ඒක මැරුනමනෙ.දැන් මට ඕවා එපා.මන් යනවා."

"ධීර්...."



ඊයෙ ශෙහාන් එක්ක රණ්ඩු වුණත් ධීර්ට දැන් ඕනි මේකෙ පිටිපස්සෙ ඉන්නෙ කවුද කියලා හොයාගන්න.ඒත් දැන් එයා හිරකූඩුවක හිරවෙලා.මොනාද කරන්නෙ කියලා හිතාගන්න බැරුව ධීර් සීතල සිමෙන්ති පොළොවෙ ඉඳගත්තා.

මේ අතරෙ අභිලාෂ් වගේම ආදිතය හිටියෙ එයාලා දැන් කරන්නෙ මොකද්ද කියලා හොයාගන්න බැරුව.

"මොකද්ද බං දැන් අපි කරන්නෙ?චීෆ් නැතුව මට කිසි ඔළුවට එන්නෙ නැහැ.."

අභිලාෂ් කරේ කල්පනා කරපු එක.ආදිත්‍යත් එයාට පුලුවන් විදිහට කල්පනා කරද්දි ධීර් නුපුරුදු පරිසරයක ඉදන් කල්පනා කරා.නුපුරුදු පරිසරයක සුපුරුදු රාජකාරිය.

"ඔවු...දැන්නෙ තේරුනේ"

ධීර්ට තේරුණා මෙතන වෙලා තියෙන දේ.එයා ශෙහාන්ව මීට් වෙලා ඔෆිස් එකෙන් එද්දි 8.37 යි.එතකොට එයා එළියට එද්දිම ක්ලීනින් සර්විස් එකේ කෙනෙක් කිව්වා ලිෆ්ට් එක වැඩ නැහැ කියලා.ඒ නිසා ධීර් පඩිපෙල බැහැලා තට්ටු තිහක් ආවා.ඒ ඇවිල්ලා කම්පැනි එකෙන් එළියට ආවෙ 8.50 ට.මොකද එයා පඩිපෙළ බැස්සෙ හෙමින්.ඉතින් ඒ වෙලාව ගියඑක සාධාරණයි.එතකොට එයාට ඇහුණ විදිහට මේ ඇටැක් එක වෙලා තියෙන්නෙ 8.30ත් 45ත් අතර.එතකොට ධීර් ශෙහාන්ගෙ ඔෆිස් එකෙන් ඇවිල්ලා ඉවරයි.දැන් තමයි ධීර්ට වෙලාතියෙන දේ පැහැදිලි වුණේ.

"අහී?"



"ධීර්?"

"මේ අහන්න.මන් කියන එක හොදට අහගන්න.මේ ඇටැක් එක වෙලා තියෙන්නෙ 8.30 ත් 8.45ත් අතර.ඒ කියන්නෙ මන් අප්පච්චිගෙ ඔෆිස් එකෙන් එළියට ආවට පස්සෙ.මන් ඔෆිස් එකෙන් පිටවුණාට පස්සෙ පඩිපෙලෙන්න් තමයි ආවෙ.ඒකත් හෙමීට.ක්ලීනින් සර්විස් එකේ කෙනා කිව්ව නිසා.මන් අප්පච්චි එක්ක තරහෙන් හිටිය නිසා මින් ඒ ගැන හිතුවෙ නැහැ. වෙලාවෙ ඒ ෆ්ලෝ එකේ හිටියෙ ක්ලීනින් සර්විස් එකේ කෙනෙක් විතරයි.ඒ මිනිහා ගැන හොයලා බලන්න.අනිත් එක අප්පච්චිගෙ තත්වෙ කොහොමද?"

"ඉක්මනටම සිහිය එයි කියලා ඩොක්ටස්ලා කියන්නෙ."

"මන් තියන්නම්.ඒක ගැන බලන්න."

තමන්ට තියෙන දක්ෂතාවය නිසා ධීර්ට පුලුවන් වුණා එයාගෙන් ප්‍රශ්න කරන්න ආව තේනුවරගෙ ෆෝන් එක හොරෙන් ගන්න.මේ

ඒකෙන් තමයි කෝල් එක ගත්තෙ.වැඩකාරයාට බොරු බෑ බොරු කාරයාට වැඩ බෑ කියනවානෙ.

මේ අතරෙ ආදිත්‍ය එක්ක ශෙහාන්ගෙ කම්පනි එකේ ක්ලීනින් සර්විස් එකේ කෙනා ගැන හොයද්දි මේ දෙන්නාට හම්බුණා ඇත්තටම මේ මිනීමැරුම කරන්න තැත් කරපු කෙනා කවුද කියලා.හොදට සැලසුම් කරලා කරන්න හදපු මේ මිණීමැරුම කාගෙදෝ වාසනාවකට නැවතිලා කියන එක තමයි අභිලාෂ්ටයි ආදිතටයි හිතුනෙ.

"මාර බේරිල්ලක්නෙ බන් සර් බේරිලා තියෙන්නෙ?"



ආදිත වගේම අභිලාෂ් මේ දුවන්නෙ දනුකගෙ ඔෆිස් එකට.

"සර් බේරුණා වගේම ධීර්වත් බේරගන්න ඕනි.එතකොට හරි."

ආදිතය දුවන ගමන්ම ඔවු කියන්න ඔලුව වැනුවා.

"සර්?"

අවසරයක් නැතුවම දනුකගෙ ඔෆිස් එකට කඩා පැන්න දෙන්නා සැලුට් කරද්දිම දනුකට තේරුණා මොකක් නමුත් හොද ආරංචියක් තමයි කියලා.

"මොකද වුණේ අභිලාෂ්?"

"හරි මිනිහාව ඇරෙස්ට් කරා.ධීර්ට මොකද කරන්නෙ?"

දනුක ඉක්මනට එයාගෙ මේසෙ උඩ තිබුණ ෆෝන් එක ගන්න ගමන් ඔෆිස් එකෙන් ඉස්සරවෙලා එළියට ආවා.

"තේනුවර කාරයා මොනවා කරනවද දන්නෙ නැහැ."

තමන්ගෙ අලුත් ලොක්කා ගැන දන්න ආදිත්‍ය වගේම අභිලාෂ් මූණට මූණ බලාගත්තෙ දනුකගෙ වෙහිකල් එකට නගින ගමන්මයි.



"මැඩම් ලියාරා?"

"ශෙහාන්ට සිහිය ආවා දනුක."

"හරි මැඩම්."

"මගේ දුව?"

"මැඩම් කෙලින්ම කොළඹ කෑම්ප් එකට එන්නකො.විනාඩි පහළවෙන් ධීර් එළියෙ."

"තැන්ක් යූ දනුක."

"යුවර් වෙල්කම් මැඩම්.පුලුවන් තරම් ඉක්මනට එන්න."

"හරි මන් මේ දැන් එනවා."

දනුකලා කෑම්ප් එකට එන අතරෙ තේනුවර ආවෙ ධීර් හිටිය රූම් එක ඇතුලට.ඒකත් තරහෙන් පුලුරන ගමන්.

"තමුන්ට එච්චර හයියක්?"

තේනුවර කෙලින්ම ධීර්ගෙ තොර පුපුරන්නම පාරක් ගැහුවෙ ධීර් ෆෝන් එක විසික් කරලා දාද්දි.

"මගෙම ෆෝන් එක ගන්න තරම්?"

75

තේනුවර ධීර්ට ගහගෙන ගහගෙන යද්දි ධීර් පුලුවන් විදිහට ඒ පාරවල් කවර් කරද්දි,ධීර්ට ආවෙ හොඳ අදහසක්.

"මේසව තේනුවර?"

අභිලාෂ්ගෙ එයා පාවිච්චි නොකරන සම්පූර්ණ නම කියද්දි තේනුවර ටිකක් පුදුම වුණා.

"මොකද්ද කියන්නෙ?"

ධීර්ගෙ ෂර්ට් එකෙන් අල්ලගත්ත තේනුවර ධීර්ව එයාගෙ මූණට සමාන්තරව ඇදලා ගත්තා.

"තමුන් මීට අවුරුදු විස්සකට කලින් අනාත නිවාසෙක දාලා ගිය තමුන්ගෙ පුතා."

තේනුවර ධීර් දිහා බැලුවෙ මරන් කන බැල්මකින්.මොකද ඒක තමයි තේනුවරගෙ ජීවිතේ තිබ්බ ලොකුම රහස.

"එයා මැරුණා.අනික තමුන් කොහොමද ඒ ගැන දන්නෙ?"

ධීර් කරේ කට කොනට නිනාවුණ එක.මොකද ධීර් තේනුවරගෙ ඔෆිස් එකට ආපු ගමන් දැක්කෙ ටේබල් එකක් උඩ තිබුණ අභිලාෂ්ගෙ පොඩිකාලෙ ෆොටෝ එකක්.ඒක තේනුවරට කොහෙන්ද කියලා කල්පනා කරද්දි තමයි එතනත් වෙලා තියෙන දේ ධීර්ට තේරුණේ.පොඩි වුණාට ධීර් කියන්නෙත් එසේ මෙසේ කෙනෙක් නෙවෙයි.මොළයක් නෙවෙයි,මොළ ගෙනාපු නැවක්.



"එදා ඔයා මේසව එහෙමත් නැත්තන් අභිලාෂ්ව ළමානිවාසෙ දාලා ගිහින් සතියකට පස්සෙ ඒ ළමා නිවාසෙ බ්ලාස්ට් එකකට අහුවුණා.ඔයා හිතුවා ඔයාගෙ පුතත් මැරුණා කියලා.ඒත් එයා වෙන නමකින් තාම ජීවත් වෙනවා.එයා ඉන්නෙ ඔයා ළඟමයි.ඒකත් එයා ඉස්සර පාවිච්චි නොකරපු නමෙන්.එයාම ඇවිල්ලා මගේ අම්මයි තාත්තයි ගැන හොයාගන්න ඕනි කියද්දි මන් හිතුවෙ එයාගෙ අම්මා ගැන විතරයි මට අමතක වුණා එයාට තාත්තා කෙනෙකුත් ඉන්නවා කියන එක.අභිලාෂ්ගෙ අම්මා බ්ලාස්ට් එකකට අහුවෙච්ච නිසා ඔයා අභිලාෂ්ව ළමානිවාසෙකට දැම්මා.සමහරවිට ඒ බ්ලාස්ට් එක කරේ ඔයාගෙ හතුරෙක් වෙන්න පුලුවන්.මන් හරිනෙ?"

තේනුවර තාමත් ඉන්නෙ පුදුම වෙලා.මොකද අවුරුද විස්සක් තිස්සෙ මැරුණා කියලා හිතපු පුතා තාම ජීවත් වෙනවා කියලා

කිව්වම තේනුවර එකපාරටම ඒක විශ්වාස කළේ නැහැ.ඒක විශ්වාස කරන්න අමාරුයිනෙ කොහොමත්.

"අභිලාෂ් මේසව තේනුවර.ඔයා හොයන ඔයාගෙ පුතා,ඒ තමයි ඔයා යටතෙ ඉන්න කැප්ටන්."

එකපාරටම තේනුවරට ධීර්ගෙ ෂර්ට් එක ඇතැරුණා.

"මිස්ටර් තේනුවර.අපි නියම කෙනාව අල්ලගත්තා.අගමැතිතුමාටත් සිහිය ආවා.දැන් මෙයාව නිදහස් කරන්න ටයිම් එක හරි."

තව සෙබලු තුන හතරක් එක්ක දනුක ආවෙ ධීර් මෙතන ගගුටිකනවා ඇති කියලා හිතාගෙන වුණත් ධීර් ලොකු ආපදාවක් නැතුව ඉන්නවා දැකලා දනුකට සතුටු හිතුනා.

"ෂුවර් සර්."



දනුකටත් සැලුට් කරපු තේනුවර එතනින් යන්න යද්දි ආදිත්‍ය වගේම අභිලාෂ් එතනට ආවෙ එයාලාගෙ සාර්තකත්වයෙන් පස්සෙ.

"ධීර්...."

අභිලාෂ් ධීර්ව තද කරලා බදාගත්තම ධීර්ට ලොකු සතුටක් දැනුනා.තමන්ට වැඩිය වැඩිමල් වුණත් තාම තනියෙන් කේස් එකක් හැන්ඩ්ල් කරලා නැති මේ දෙන්නා අද ධීර්වම බේරගන්න තනියෙන් කේස් එකක් හැන්ඩ්ල් කරා කියන සතුට ධීර්ට තිබුණා.

"ඔයාට අවුලක් නැනැ?"

ධීර් කරේ නෑ කියන්න ඔලුව වනපු එක.

"අප්පච්චි?"

ධීර්ගෙ ඔලුවට මුලින්ම ආව වචනෙ අප්පච්චී වෙද්දි දනුක ඇවිල්ලා ධීර්ගෙ ඔලුවට තට්ටුවක් දැම්මා.

"බයවෙන්න එපා.දැන් හැමදේම හරි.අම්මි එලියෙ ඔයා එනකල් බලන් ඉන්නවා."

හා කියන්න ඔලුව හොල්ලපු ධීර් අභිලාෂ්ගෙ අතින් අල්ලගෙන එතනින් එළියට ආවා.තාමත් ඇස් රතුවෙලා සුදුමැලි වෙලා හිටිය ලියාරා ගෞරද් ධීර්ව දැකලා ආපහු අඩන්න ගත්තා.



"දැන් මන් එළියට ආවනෙ අම්මි.අඩන්න එපා."

කියන්න කිසි දෙයක් මතක් නොවුණ පාර ධීර් අඩන්න එපා කියලා විතරක් කියලා එයාට වඩා අගල් දෙකක් විතර කොට ලියාරාව බදාගත්තා.

"මැඩම්,සර් බලන් ඉන්නවා ඔය දෙන්නා එනකල්."

දනුක ලියාරාට කාර් එකට නගින්න කියලා සන් කරලා ධීර්දිහා බැලුවා.

"ආදිත්‍යලත් එක්ක එනවද්?"

ධීර් හා කියන්න ඔලුව අනලා අභිලාෂ්ට එහාපැත්තෙන් නැග්ගෙ ඉස්සරහින් ආදිත්‍ය වගේම තේනුවර නගිද්දි.

"සොරි,මං හිටියෙ වැරදි වැටහීමක."

තේනුවර අවංකවම ධීර්ගෙන් සමාව ඉල්ලද්දි ධීර් කරේ තේනුවර එක්ක හිනාවෙච්ච එක.ඊටපස්සෙ ආදිත්‍ය,අභිලාෂ් වගේම තේනුවර එක වාහනේකට නගිද්දි ලියාරායි දනුකයි එක වාහනේකට නැග්ගා.ධීර් එක්ක අභිලාෂ් පිටිපස්සෙන් නගිද්දි ආදි ඩ්‍රයිනින් ශීට් එකට නැග්ගා.ටික දුරක් ආවම ධීර්ගෙ ඔළුවට ක්ෂනිකව ආපු අදහස ධීර් ක්‍රියාවට නැංවුවා.

"ආදි විනාඩියකට වාහනේ නවත්තන්න"



අභිලාෂ් වගේම අනිත් දෙන්නත් ඇයි කියලා බලන්න ධීර් දිහා බැලුවත් ධීර් හිටියෙ ෂටර් එකෙන් එළිය බලාගෙන.වාහනේ නතර කරාම ධීර් කෙලින්ම බැලුවෙ අභිලාෂ් දිහා.

"අම්මා ගැන කියනවා නම් ඒක ඔයාට ඔයාගෙ තාත්තාගෙන් පස්සෙ හෙමීට දැනගන්න පුලුවන්...බට් ඔයාගෙ තාත්තා තමයි මේ ඉස්සරහා ඉන්නෙ.ජෙනරල් අභිමෙවන් මේසව තේනුවර.එහෙනම් තාත්තලා පුතාලා එළියට බැහැලා කතා කරගන්නකො..."

ධීර් ආදිත්‍ය දිහාට සෝ ඩන් බැල්මක් දීලා ෂීට් එකට හේත්තුවෙලා ඇස් වහගත්තා.

"පුතා...ටිකක් කතා කරමු?"

අභිලාෂ් ඔලුව වනලා කාර් එකෙන් බැස්සා.ඇස් වහන් ඉන්න ධීර්ට ඇහුනෙ තාත්තාගෙයි පුතාගෙයි කතාව විතරයි.

"මට සමාව දෙන්න පුලුවන්ද?"

"ඇයි මාවයි මල්ලිවයි දාලා ගියේ?"

ධීර් එතනින් එහාට ඒ දෙන්නාගෙ කතාවට ඇහුම්කන් දුන්නෙ නැහැ.මොකද එයා එයාගෙ යුතුකම කරලා ඉවරයි විනාඩි ගානකට පස්සෙ අභිලාෂ් වගේම තේනුවරත් කාර් එකට නැග්ගෙ ඇස්වල කඳුලු පුරවගෙන.අභිලාෂ් ධීර්ගෙ උරහිසෙන් ඔළුව තියාගනිද්දි තේනුවර ෂටර් එකෙන් ඔලුව තියාගත්තා.විනාඩි පහළවක් විතර යද්දි ධීර් වගේම අනිත් තුන්දෙනත් හිටියෙ ශෙහාන් හිටිය රූම් එක ඉස්සරහා.

"ඇතුළට යන්න."



රූම් එකෙන් එළියට ආව නර්ස් කෙනෙක් මේ හතර දෙනාට ඇතුලට යන්න කියද්දි ධීර් ඉස්සර් වුණා.

"මැණික?"

ශෙහාන්ට ධීර්ව අඳුරගන්නත් අමාරු වුණා.මොකද ධීර් හිටිඑ දූවිලි කේ ගැවිච්ච පරණ ඇඳුම් ඇදගෙන.ඒ මදිවට මූණ ඉදමිලා,තොල පැලිලා.කොච්චර ස්ට්‍රෝන්ග් වුණත් ශෙහාන්ව දකිද්දි ධීර්ට ඇඬුණා.

"මොකද මැණිකමේ?"

තමන් නිසා ධීර්ට දවස් තුනක් හිරේ ඉන්න වුණ එක ගැන මොකුත් නොදන්න ශෙහාන් ඇයි කියලා ඇහුවම වටේ හිටිය අයටනම් හිනා ගියා.

"දිග කතාවක්...."

ධීර් දිග කතාවක් කියලා කතාව මාරුකරන්න යද්දි ලියාරා මැද්දෙන් පැන්නා.මොකද ධීර් කවදාවත් නතුව ධීර් අඩන නිසා එයාටයි ශෙහානටයි නිදහසේ ඉන්න ඉඩ දෙන්නඕනි කියලා ලියාරාට හිතුණා.

"අප්පච්චිලා දූලා කතා කරගන්නකො...මං ඔයාව පස්සෙ අල්ලගන්නම් ශෙහාන්..."

ලියාලා රූම් එකෙන් එළියට යද්දි අනිත් අයත් එයාව අනුගමනය කරා.

"උරහිසකටද වැදුනේ?"



ධීර් බලන් හිටියෙ බැන්ඩේජ් කරලා තියෙන ශෙහාන්ගෙ අව් උරහිස දිහා.

"සොරි මැනික!"

අහපු ප්‍රශ්නෙට නැතුව ශෙහාන් එකපාරටම සොරි කියලා කියද්දි ධීර් ශෙහාන් දිහා බැලුවෙ ඇයි අහන බැල්මකින්.

"කම්පැනීස් දෙක බාරගන්න බලකරාට."

ධීර්ට හයියෙන් හින ගියේ ශෙහාන්ගෙ මේ විහිලුව නිසා වෙච්ච විපත්තිය මතක් වෙලා.

"ඇයි හිනාවෙන්නෙ?"

"ඔය කම්පැනීස් දෙක නිසා මන් දවස් තුනක් හිරේ හිටියා."

"මොකද්ද ඒ කතාවෙ තේරුම?"

"ඒක දිගම දිග කතාවක් අනේ.දැන් කියන්න බැහැ මහන්සියි."

"අනේ මගේ කට."

ධීර් ශෙහාන්ට තුරුල් වුණේ තුවාලෙ නොපෑරෙන විදිහට.

"ටිකක් නිදහසේ හිටියා නම් හොඳයි."



හිතෙන් හිතන ගමන් ධීර් කල්පනා කරේ මේපාරනම් දනුකගෙන් මර්ණ තර්ජන එල්ල කරලා හරි නිවාඩුවක් ගන්නවා කියලා හිතන ගමන්.

*දින කිහිපයකට පසු.*

"කියන්න අප්පච්චි..."

"ඉක්මනට අර දෙන්නත් එක්ක අංකල් විරේන්ගෙ ඔෆිස් එකට එන්න."

"විසාල කරදරයක් වුණානෙ මේක!"

"විහිලු නෙවෙයි!"

"හදිස්සියක්ද?"

"ඔවු."

"හා එන්නම්..."

*මෙවර ධීර්ට ලැබෙන හදිසි ඇමතුම කුමක් ගැනද?*

***තවත් විමර්ෂණ පෙලක් සමගින් දෙවන කොටසෙන් හමුවෙමු.***



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශය අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත් කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම වැඩසටහනක් ඌ බව අධ්‍යාපනඥයන් ගේ පිළිගැනීම නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කර ඔන්නට යොමුවීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාව ට අනාගත ලෝකය පෙන්වා දෙන නූතන පාසල නූතන තාක්ෂණ මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකු ලබන ආස්වාදය අන් කිසිවකුගෙන් වත් ලබා ලබාදිය නොහැකි නිසාය තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම් මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොත පතින් ලක්ව ගන්නට මෙන්ම අධ්‍යාපනය ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහමායාබාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් හේමාලා උපහාර ග්‍රන්ථ කරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයෙන් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සයිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටු කළ හෙම්මාලා දැක්වීමද මෙහි මූලික අරමුණයි මහනුවර මහාමායාබාලිකා විද්‍යාලයේ දියණියන් විදුහල්පති පුතුමිය ගුරුබවතුන් දෙමව්පියන් ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල්

නියෝජනය කරන සියලු දෙනාටද දියවඩන නිලමේ තුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්යමණ්ඩලයට ද මෙම කාර්ය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහ ලේකම් (ව්‍යාපෘති නිර්මාතෘ)